# මාසික මහ සභා රැස්වීම - 2023/03/14 දින
# අලව්ව ප්‍රාදේශීය සභාව

2023/03/14 වන දින පෙ.ව 09.30 ට පමණ අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී පවත්වන්නට යෙදුන අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 60 වන මහ සභා රැස්වීම පිළිබඳ සංක්ෂිප්ත වාර්තාවයි.

**මෙදින සහභාගී වූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු සභාපතිනි - පද්මා වැත්තැව මැතිනිය
2. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.ඒ කරුණාරත්න මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජිව වික්‍රමනායක මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඊ.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය

**මෙදින මහ සභාවට සහභාගී නොවූ ගරු මන්ත්‍රීතුමන්ලා**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ VI වන සැසිවාරයේ 60 වන මහ සභා රැස්වීමට සපැමිණි අපේ සියලුම මන්ත්‍රීතුමන්ලා සහ මන්ත්‍රීතුමියන්ලාත් අලව්ව ප්‍රාදේශීය සභාවේ ලේකම්තුමිය ප්‍රධාන කොටගත් එම නිළධාරීන් ඇතුළු සියලු දෙනාත් ඉතා ගෞරවයෙන් යුතුව පිළිගනු ලබනවා.

## 01. 2023.02.14 දින මහ සභා වාර්තාව ස්ථිර කිරීම.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

2023.02.14 දින මහ සභා රැස්වීම් වාර්තාව ඔබතුමන්ලා වෙත ලබාදී තිබෙනවා. එම වාර්තාව ස්ථිර කිරීමට තීරණයක් ගන්නා මෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, 2023.02.14 දින පැවති VI වන සැසිවාරයේ 59 වන මහ සභා රැස්වීම් වාර්තාව පහත සංශෝධන වලට යටත්ව ස්ථිර කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

<u>මහ සභා රැස්වීම් වාර්තාවේ සංශෝධන</u>

i. 2023.02.14 දින මහ සභා රැස්වීම් සභා වාර්තාවේ 15 වන පිටුවේ අංක 03.13 - බෝයවලාන පොලිස් ස්ථානය පිහිටි ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරාදීම සම්බන්ධව යන ලිපිය යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්. ජයතිලක මැතිතුමාගේ ප්‍රකාශයේ **"**නමුත් ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් වෙනුවෙන් සේවා පියස හදන එකටත් අපි කවුරුවත් දන්නැතුව කෑල්ලක් **වැඩ කරලා** තිබෙනවා.**"** යන කොටස **"**නමුත් ප්‍රදේශයේ ජනතාවගේ පොදු පහසුකම් වෙනුවෙන් සේවා පියස හදන එකටත් අපි කවුරුවත් දන්නැතුව කෑල්ලක් **වෙන් කරලා** තිබෙනවා.**"** ලෙස සංශෝධනය විය යුතුය.

ii. 2023.02.14 දින මහ සභා රැස්වීම් සභා වාර්තාවේ 16 වන පිටුවේ අංක 03.13 - බෝයවලාන පොලිස් ස්ථානය පිහිටි ඉඩම ශ්‍රී ලංකා පොලීසිය වෙත පවරාදීම සම්බන්ධව යන ලිපියේ **"**ඒ අනුව කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරු දෙදෙනාගේ සහභාගිත්වයෙන් මුළු ඉඩමම මැන ගම්වාසීන්ගේ පොදු කටයුතු සඳහා ඉඩම් කොටසක් නියමිත ලෙස වෙන් කර දීමෙන් අනතුරුව මේ සඳහා අනුමැතිය **ලබා සුදුසු බවට** ඒකමතිකව තීරණය විය.**"** යන තීරණය **"**ඒ අනුව කොට්ඨාශය නියෝජනය කරන මන්ත්‍රීවරු දෙදෙනාගේ සහභාගිත්වයෙන් මුළු ඉඩමම මැන ගම්වාසීන්ගේ පොදු කටයුතු සඳහා ඉඩම් කොටසක් නියමිත ලෙස වෙන් කර දීමෙන් අනතුරුව මේ සඳහා අනුමැතිය **ලබා දීම සුදුසු බවට** ඒකමතිකව තීරණය විය.**"** ලෙස සංශෝධනය විය යුතුය.

iii. 2023.02.14 දින මහ සභා රැස්වීම් සභා වාර්තාවේ 17 වන පිටුවේ අංක 03.15 - අලව්ව ප්‍රාදේශිය සභාවේ ප්‍රජා සංවර්ධන අංශයේ පරිගණක යන්ත්‍රය අළුත්වැඩියා කිරීම සඳහා මිලගණන් ඉදිරිපත් කිරීම යන ලිපිය යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමාගේ ප්‍රකාශයේ **"**අවම මිලගණන් ඉදිරිපත් කර ඇති නො.137, මහ විදිය, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක රියල් පී.සී සොලියුෂන් ආයතනයෙන් **මිල දී ගැනීම** සුදුසු බවට මම යෝජනා කරනවා.**"**යන කොටස **"**අවම මිලගණන් ඉදිරිපත් කර ඇති නො.137, මහ විදිය, අලව්ව ලිපිනයේ ක්‍රියාත්මක රියල් පී.සී සොලියුෂන් ආයතනයෙන් **අළුත්වැඩියා කිරීම** සුදුසු බවට මම යෝජනා කරනවා.**"** ලෙස සංශෝධනය විය යුතුය.

ඒ අනුව 2023.02.14 දින පැවති VI වන සැසිවාරයේ 59 වන මහ සභා රැස්වීම් වාර්තාව ඉහත සංශෝධන වලට යටත්ව ඒකමතිකව සභා සම්මත විය.

## 02. ගරු සභාපතිතුමිය විසින් කරනු ලබන විශේෂ නිවේදන - නැත

## 03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ පෙත්සම් පැමිණිලි හා සන්නිවේදන සභාව ඉදිරියේ තැබීම.

### 03.1 රජයේ ඉඩම් කොටසක් දීර්සකාලීන බදු පදනම යටතේ ලබාදීම.

අංක 985 කන්දේගෙදර උතුර ග්‍රාම නිලධාරී වසමේ අ.ග.පි. 444 හි කැබලි අංක 643 න් අක්කර 01 රූඩ් 01 ක ප්‍රමාණයක් නැවුම් පොල්තෙල් කර්මාන්ත ශාලාවක් සඳහා දීර්සකාලීන බදු පදනම යටතේ ලබාගැනීම සඳහා අධ්‍යක්ෂ, ලවන්‍යා එන්ටප්‍රයිසස් පුද්ගලික සමාගම විසින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අලව්ව වෙත ලිපියක් යොමු කර ඇති බවත් ඒ අනුව අදාල ඉඩම් කොටස දීර්සකාලීන බදු පදනම යටතේ එම ආයතනය වෙත ලබාදීම සලකා බැලීම සඳහා අප සභාවේ එකඟතාවය ලබාදෙන ලෙසත් ඉල්ලීමක් කරමින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලය, අලව්ව විසින් 2022.02.28 දිනැතිව යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වැලිකරේ ඉඩම් කැබැල්ල ගැනයි ඔය කියන්නේ. එතන අක්කර 10 ක් 15 ක් පමණ තිබෙනවා. දැනටත් එක් අයෙකුට දීලා තිබෙනවා. ඒකේ වරදකුත් නෑ. එහෙම ආයතනයක් පටන්ගත්තම රැකියා ටිකක් හැදිලා ලොකු ප්‍රබෝධයක් ප්‍රදේශයට ලැබෙනවා. ඒකේ වරදක් මමනම් දකින්නේ නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,කාලෝචිත යෝජනාවක් හැටියට දකිනවා. අපේ ප්‍රදේශය දෙස බැලුවම අපේ ජනතාව විශාල වශයෙන් අමතර ආදායම් ලබන එකක් තමයි මේ පොල්. ඒ වගේම රැකියා ප්‍රමාණයකුත් උත්පාදනය වෙයි. ප්‍රදේශයේ ආයෝජකයෙක් බිහි වෙනවා නම් ඒක අපේ සභා බල ප්‍රදේශයේ කෙනෙකුගේ ආර්ථිකය ශක්තිමත් වෙන්න කාරණයක් වෙනවා. ඒ සියල්ලම අපි දීර්සකාලීනව කල්පනා කර බලාඅපේ එකඟතාවය ලබාදීම සුදුසුයි කියලා යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ යෝජනාවෙන් ප්‍රදේශයේ ජනතාවට රැකියා ලැබෙන්න පුළුවන්. නමුත් පොල්තෙල් කර්මාන්තශාලාවක් නිසා පරිසරයට යම් හානියක් වෙන්න ඉඩ තිබෙනවා.මොකද ජලයට තෙල් මුසුවෙන්න පුළුවන්. ඒ වගේ පරිසර ප්‍රශ්න ආවොත් සභාවට තමයි පරිසර ප්‍රශ්නය ඉක්මනින්ම යොමු වෙන්නේ. ඒ නිසා ශිවිසුම්ගත වීමේදී හෝ එහෙම නැත්නම් බදු පදනමක් මත ලබාදීමේදී අපි සභාවක් ලෙස විශේෂයෙන් මේ පරිසර ප්‍රශ්නය ගැන විමසිලිමත් වෙන එක සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේකෙදී ප්‍රාදේශීය ලේකම් කාර්යාලය හා ප්‍රාදේශීය සභාව අතර සුහදත්වයක් ඇතිවෙන විදියේ දෙයක් තමයි මේ වෙන්න යන්නේ. ඒ ප්‍රදේශය නියෝජනය කරන මන්ත්‍රීතුමන්ලාත් ඒ පිළිබඳව අදහස් දැක්වුවා. ඒ වගේම මෙතුමා කියපු ඒ පරිසර ප්‍රශ්නය පිළිබඳවත් අපේ අදාල නිලධාරීන් ගිහිල්ලා බලලා සමීක්ෂණයක් කරනවා නම් හොඳයි. පොල්තෙල් කර්මාන්තය කියන්නේ හොඳ දෙයක්. වර්තමානය වන විට රැකියා පමණක් නොවෙයි බොහෝ දේ සිද්ධ වෙනවා. මොකද අපේ බල ප්‍රදේශයේ කර්මාන්තයක් නගා සිටුවීමට දරණ ප්‍රයත්නයක් නිසා

මේ පරිසර ප්‍රශ්නය ගැනත් හොයලා ප්‍රාදේශීය ලේකම්තුමියත් එකඟ නම් අපිටත් එකඟ වෙන්න පුළුවන්. ඒ නිසා මේ සඳහා එකඟ වීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ප්‍රාදේශීය ලේකම්තුමිය මේක අපිට යොමු කරලා තිබෙන්නේ මේ ගැන සලකා බලන්න. මේ ප්‍රදේශයේ තිබෙන විශාල ඉඩමක්. ඇත්තෙන්ම පොල් වලින් නිෂ්පාදිත දෙයක් තමයි කරන්න යන්නේ. මේකෙන් ප්‍රදේශයට හානියක් නොවෙනවා නම්, ප්‍රදේශයේ රැකියා ප්‍රශ්නයට විසඳුමක් ලැබෙනවා නම් ඒකත් ලොකු දෙයක්. ඒ නිසා ඒ සියල්ල ගැන කල්පනා කරලා වැඩි ප්‍රයෝජනයක් මේ පළාතට සිද්ධ වෙනවා නම් හොඳයි කියන එක මම ප්‍රකාශ කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි ප්‍රාදේශීය ලේකම්තුමියට ස්තූතිවන්ත වෙන්න ඕනෑ ගැටුම් ඇති නොවන විදියට කටයුතු කලාට. ඒක අපේ අණපනත් වලට වඩා සාම්ප්‍රදායික නීතියක්. සභා ආරම්භයේ ඉඳලම එහෙම සිද්ධ වුනා. මම හිතනවා මේ කාරණාවෙදි අපේ ගරු මන්ත්‍රීතුමන්ලා කීප දෙනෙක්ම කීවා වගේ, ඒ පරිසර ගැටළු වලදී අදාල ආයතන වලින් විමසලා ඇති. ඒ ආයතනත් ඒවාට පිළිතුරු ලබා දෙයි. මේ සඳහා අපේ එකඟතාවය ලබා දීම උචිතයි. විශේෂයෙන්ම ඕක නොදුන්නොත් අපි විශාල අපවාදයකට පත්වෙනවා. ඒ නිසා ව්‍යාපාරයට ආශිර්වාද කරලා ඒ එකඟතාවය ලබා දීම සුදුසුයි.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

මේ ලිපිය ලැබුනු වෙලාවේ මම හිතුවේ, ඔබතුමාලට මතක ඇති සංවර්ධන සභාවේදී තරුණ ව්‍යවසායකයින්ගෙන් ඒ ප්‍රදේශයේ තරුණයෙක් දැනට ඉන්න ගරු ඇමතිතුමා ගෙන්නලා අපිට දැනුවත් කිරීමක් කලා, මෙයා පොල් කර්මාන්තය කරගෙන යනවා, මෙයාගේ පියා නොයෙකුත් නිෂ්පාදන කරලා තිබෙනවා, මේ නිෂ්පාදන පිටරට යවනවා කියලා. මම මේ ලිපිය ලැබුනම හිතුවේ ඒ තරුණයාගේ කටයුත්තක් කියලා. ඊට පසුව තමයි දින 03 කට පමණ පෙර නාරම්මල පුද්ගලයෙක් ඇවිත් එයා තමයි මේක කරන්නේ කියලා දැනුවත් කලේ. අද මේ විදියේ දේශීය කර්මාන්ත ආරම්භ වන එක ඉතාම වටිනවා. වෙනදට නම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙන් පිඹුරේ සැලැස්මක් අපට එවනවා. පිඹුරු අංකයකුත් අපිට දුන්නා නම් හොඳයි. මොකද කොතනද මේක තියෙන්නේ කියන එක අපිට දැනුවත් වෙන්න තිබුනා. ඒ ටික අපිට ලබා දෙන්න කියලයි ඒ වගේම පරිසර ප්‍රශ්නයක් නොවන ආකාරයට කරගෙන යනවා නම් අපි එකඟයි කියලා අපි දන්වමු.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඊලඟට මෙවැනි දෙයක් අපිට එවනවා නම් ඒ පිඹුරත් අපිට එවන්න කියලා දන්වලා යවන්න.

ඒ අනුව අංක 985 කන්දේගෙදර උතුර ග්‍රාම නිලධාරී වසමේ අ.ග.පි. 444 හි කැබලි අංක 643 න් අක්කර 01 රූඩ් 01 ක ප්‍රමාණයක් නැවුම් පොල්තෙල් කර්මාන්ත ශාලාවක් සඳහා ලවන්‍යා එන්ටප්‍රයිසස් පුද්ගලික සමාගම වෙත දීර්ඝකාලීන බදු පදනම යටතේ ලබාදීමට එකඟතාවය ලබාදීම සුදුසු බවට තීරණය විය.

**03.2** <u>**තක්සේරු ලේඛනයෙන් දේපලක් ඉවත් කරගැනීම.**</u>

අලව්ව නිවාස යෝජනා ක්‍රමයේ 25/11 වම වරිපනම් අංකය යටතේ ඇති නිවසේ කිසිවෙකුත් පදිංචි නොවන බවත් එම නිවස දැනට කොටස් වශයෙන් කඩා වැටෙමින් පවතින බවත් එබැවින් දේපල

හිමිකරු විසින් එම දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත් කරදෙන ලෙසත් ඉල්ලීමක් කරමින් අංක 89, මහ වීදිය, අලව්ව ලිපිනයේ ජේ.එම්. ගුණතිලක මයා විසින් ලිපියක් යොමු කර ඇත. ඒ සම්බන්ධයෙන් ආදායම් පරීක්ෂක ක්ෂේත්‍ර පරීක්ෂාවේදී එම නිවස ගරා වැටෙමින් පවතින බවට නිරීක්ෂණය වූ බව දන්වා ඇති අතර ඒ අනුව ඉහත දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවීම සුදුසු බවට ආදායම් ප්‍රවර්ධන නිලධාරී විසින් දන්වා ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව නිවාස යෝජනා ක්‍රමයේ 25/11 වම වරිපනම් අංකය යටතේ ඇති දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව නිවාස යෝජනා ක්‍රමයේ 25/11 වම වරිපනම් අංකය යටතේ ඇති දේපල තක්සේරු ලේඛනයෙන් ඉවත් කිරීම සඳහා තක්සේරු දෙපාර්තමේන්තුව වෙත යැවීම සුදුසු බවට තීරණය විය.

**03.3** <u>**නව වරිපනම් අංකයක් ලබා ගැනීම.**</u>

අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ අංක 1001, අලව්ව දකුණ ග්‍රාම නිලධාරී වසමේ, අලව්ව ගමේ, සමඟි බෙදුම් ඔප්පු අංක 1063 දරණ අස්සැද්දුම පිල්ලෑව හෙවත් කොස්ගහමුලවත්ත සහ අස්සැද්දුම කුඹුරේ කොටසක් නමැති ඉඩමේ පිඹුරු අංක 6746/8325/L සහ 2019.08.25 දිනැති පිඹුරේ කැබලි අංක 02 දරණ පර්චස් 05 ක් වූ ඉඩමට නව වරිපනම් අංකයක් ලබා දෙන මෙන් ඉල්ලීමක් කරමින් කම්බිවත්ත, හුම්බුළුව, අලව්ව ලිපිනයේ ජේ.එම්.ඩී.ඩී. ජයකඩු මිය විසින් ලිපියක් යොමුකර ඇත. ආදායම් පරීක්ෂක ස්ථානීය පරීක්ෂණ වාර්තාවට අනුව මෙම දේපල කුරුණෑගල පාර, වම අංක 53/1 හා අංක 55 දරණ අංක අතර පිහිටි දේපලක් බවත් අංක 55 න් කැබලි වූ කොටස් බවට වැඩිදුරටත් නිරීක්ෂණය වූ බවත් ඒ අනුව නව වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවත් වාර්තා කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,අංක 1001, අලව්ව දකුණ ග්‍රාම නිලධාරී වසමේ, අලව්ව ගමේ, සමඟි බෙදුම් ඔප්පු අංක 1063 දරණ අස්සැද්දුම පිල්ලෑව හෙවත් කොස්ගහමුලවත්ත සහ අස්සැද්දුම කුඹුරේ කොටසක් නමැති ඉඩමේ පිඹුරු අංක 6746/8325/L සහ 2019.08.25 දිනැති පිඹුරේ කැබලි අංක 02 දරණ පර්චස් 05 ක් වූ ඉඩමට නව වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභා බලප්‍රදේශයේ අංක 1001, අලව්ව දකුණ ග්‍රාම නිලධාරී වසමේ, අලව්ව ගමේ, සමඟි බෙදුම් ඔප්පු අංක 1063 දරණ අස්සැද්දුම පිල්ලෑව හෙවත් කොස්ගහමුලවත්ත සහ අස්සැද්දුම කුඹුරේ කොටසක් නමැති ඉඩමේ පිඹුරු අංක 6746/8325/L සහ 2019.08.25 දිනැති

පිඹුරේ කැබලි අංක 02 දරණ පර්චස් 05 ක් වූ ඉඩමට නව වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවට තීරණය විය.

**03.4 <u>2022 වර්ෂය තක්සේරු ලේඛන නොලැබීම සම්බන්ධව.</u>**

කුරුණෑගල පාර, වම අංක 63B දරණ ඉඩම සඳහා2021 වර්ෂය දක්වා වරිපනම් බදු ගෙවූ බවත් 2022 වර්ෂය සඳහා තක්සේරු ලේඛන නොලැබුනු බවත් එබැවින් වරිපනම් බදු ගෙවීම සඳහා අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් නො. 57, නාරම්මල පාර, අලව්ව ලිපිනයේ ඩබ්.ඒ.ජේ. රණසිංහ මහතා විසින් ලිපියක් යොමු කර ඇත. ආදායම් පරීක්ෂක ස්ථානීය පරීක්ෂණ වාර්තාවට අනුව මෙම දේපල කුරුණෑගල පාර වම අංක 63 A හා අංක 65 දරණ අංක අතර පිහිටි දේපලක් බවත් 2021 වර්ෂය දක්වා ප්‍රාදේශිය සභාව විසින් අංක 63/B ලෙස තාවකාලික අංකයක් ලබා දී ඇති බවත් ඒ අනුව මෙම දේපල සඳහා වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවත් වාර්තා කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, කුරුණෑගල පාර, වම අංක 63B දරණ ඉඩම සඳහා වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව කුරුණෑගල පාර, වම අංක 63B දරණ ඉඩම සඳහා වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවට තීරණය විය.

**03.5 <u>නව වරිපනම් අංකයක් ලබා ගැනීම සඳහා.</u>**

නාරම්මල පාර, අලව්ව අංක 299 හි පදිංචි හැඳුනුම්පත් අංක 893050655V දරණ වක්වැල්ල ගමගේ කළණ හරුන් ගමගේ මයාට අයත්ව තිබූ දම්පැලැස්ස දකුණ නව ඔප්පු අංක 1317 දරණ ඉඩම තමන් විසින් මිලදී ගත් බවත් ඒ සඳහා නව වරිපණම් අංකයක් ලබා දෙන ලෙසත් ඉල්ලීමක් කරමින් ජයම්වත්ත, හුම්බුළුව, අලව්ව ලිපිනයේ ඩබ්.පී.පී.එන්. ජයසිංහ මහතා විසින් ලිපියක් යොමුකර ඇත. ආදායම් පරීක්ෂක ස්ථානීය පරීක්ෂණ වාර්තාවට අනුව මෙම දේපල දම්පැලැස්ස පාර දකුණ අංක 258 හා 282 අතර පිහිටි දේපලක් බවත් එම දේපල අංක 280 දරණ දේපලෙන් කැබලි වූ කොටසක් බවට නිරීක්ෂණය වූ බවත් ඒ අනුව එම කොටස සඳහා නව වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවත් වාර්තා කර ඇත. මේ සම්බන්ධයෙන් තීරණයක් ලබාගැනීම සඳහා ඉදිරිපත් කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ජයම්වත්ත, හුම්බුළුව, අලව්ව ලිපිනයේ ඩබ්.පී.පී.එන්. ජයසිංහ මහතා විසින් මිලදී ගත් දම්පැලැස්ස දකුණ නව ඔප්පු අංක 1317 දරණ ඉඩම සඳහා නව වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ජයම්වත්ත, හුම්බුළුව, අලව්ව ලිපිනයේ ඩබ්.පී.පී.එන්. ජයසිංහ මහතා විසින් මිලදී ගත් දම්පැලැස්ස දකුණ නව ඔප්පු අංක 1317 දරණ ඉඩම සඳහා නව වරිපනම් අංකයක් ලබා දීම සුදුසු බවට තීරණය විය.

**3.6 <u>මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයෙන් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.</u>**

පරමාඋල්ල කොට්ඨාශයේ පහත සඳහන් අතුරු මාර්ග මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය මඟින් ප්‍රතිසංස්කරණය කිරීමට අවශ්‍ය කටයුතු සලසා දෙන ලෙස ඉල්ලීමක් කරමින් මිරිහෙලිය, අලව්ව ලිපිනයේ ජේ.ඒ. සමන් මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

- ගල්වාරම අතුරු මාර්ගය අවශ්‍ය කොටස්
- පල්ලේමෝරුගම දේවාල කැලේ මාර්ගය අවශ්‍ය කොටස්
- මිරිහෙලිය ප්‍රධාන මාර්ගයේ අවශ්‍ය ස්ථානඅවශ්‍ය කොටස්
- ගල්වාරම සිට බුජ්ජොමුව දෙසට මාර්ගයඅවශ්‍ය කොටස්

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි,පරමාඋල්ල කොට්ඨාශයේ ඉහත සඳහන් අතුරු මාර්ග මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය මඟින් ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පරමාඋල්ල කොට්ඨාශයේ ඉහත සඳහන් අතුරු මාර්ග මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය මඟින් ප්‍රතිසංස්කරණය කිරීම සුදුසු බවට තීරණය විය.

**3.7<u>මෝටර් ග්‍රේඩර් යන්ත්‍රයෙන් මාර්ග ප්‍රතිසංස්කරණය කිරීම.</u>**

පරමාඋල්ල කොට්ඨාශයේ ගල්පොත්තේපොල ග්‍රාම නිලධාරී වසමේ ගල්පොත්තේපොල රවුම් පාරේ අවශ්‍ය කොටස්, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදවා සංවර්ධනය කර දෙන ලෙස ඉල්ලීමක් කරමින් ගල්පොත්තේපොල, අලව්ව ලිපිනයේ ආර්.ආර්. ජයතිලක මයා විසින් ඉදිරිපත් කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය**

ගරු සභාපතිතුමියනි, පරමාඋල්ල කොට්ඨාශයේ ගල්පොත්තේපොල ග්‍රාම නිලධාරී වසමේ ගල්පොත්තේපොල රවුම් පාරේ අවශ්‍ය කොටස්, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදවා සංවර්ධනය කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඔය මාර්ග ඇත්තෙන්ම සංවර්ධනය කරන්න ඕනැ. ඒ වගේම අපි අවස්ථා කිහිපයකදීම සංවර්ධනය කලයුතු මාර්ග පිළිබඳව ලිපි යොමු කරල තිබෙනවා. ඒවාට ප්‍රමුඛතාව දීලා ඔය මාර්ග වලට මෝටර් ග්‍රේඩරය ලබා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
පෙර කරන ලද ඉල්ලීම් වලට ප්‍රමුඛතාවය දීලා තමයි මේවාට අවස්ථාව ලබාදෙන්නේ.

ඒ අනුව පරමාඋල්ල කොට්ඨාශයේ ගල්පොත්තේපොල ග්‍රාම නිලධාරී වසමේ ගල්පොත්තේපොල රවුම් පාරේ අවශ්‍යා කොටස්, මෝටර් ග්‍රේඩර් යන්ත්‍රය යොදවා සංවර්ධනය කිරීම සුදුසු බවට තීරණය විය.

**3.8 ස්තූතිය පුද කිරීම.**
අග්බෝව ප්‍රාථමික විද්‍යාලයේ ඉදිරි සංවර්ධනය සහ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපනික සංවර්ධනය උදෙසා ආදි ශිෂ්‍ය සංගමය මගින් 2023.02.25 දින සිදුකරන ලද සංස්කෘතික කෝලම් නාට්‍ය සහ සල්පිල් වෙන්දේසිය සාර්ථක කරගැනීම සඳහා විදුලි බුබුළු හා GI බට ලබාදීම හා ප්‍රවාහනය කරදීම වෙනුවෙන් ස්තූතිය පල කරමින් අග්බෝවප්‍රාථමික විද්‍යාලයේ ආදි ශිෂ්‍ය සංගමයේ විදුහල්පති හිමි විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
මෙම ලිපිය මගින්, අග්බෝව ප්‍රාථමික විද්‍යාලයේ ඉදිරි සංවර්ධනය සහ දරුවන්ගේ ඉදිරි අධ්‍යාපනික සංවර්ධනය උදෙසා ආදි ශිෂ්‍ය සංගමය මගින් 2023.02.25 දින සිදුකරන ලද සංස්කෘතික කෝලම් නාට්‍ය සහ සල්පිල් වෙන්දේසිය සාර්ථක කරගැනීම සඳහා විදුලි බුබුළු හා GI බට ලබාදීම හා ප්‍රවාහනය කරදීම වෙනුවෙන් විදුහල්පති හිමි ඇතුළු ආචාර්ය මණ්ඩලයේ සහ ආදි ශිෂ්‍ය සංගමයේ ප්‍රණාමය පුදකරලා තිබෙනවා.

**3.9 JCB යන්ත්‍රය ලබාගැනීම.**
නුගවෙල පුරාණ විහාරස්ථ බෝමළුවට යන මාර්ගය පිළිසකර කරමින් තිබෙන බැවින් වෙලට කඩාවැටුන ගල්බැම්මේ සුන්බුන් ඉවත් කරගැනීම සඳහා අපසභාවේ JCB යන්ත්‍රය එක් දිනකට ලබාදෙන ලෙස ඉල්ලීමක් කරමින් නුගවෙල පුරාණ විහාරස්ථානයේ විහාරාධිපති පූජ්‍ය මකුල්වැවේ විමලජෝති ස්ථවිර විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
ඔබතුමාලා දන්නවා නුගවෙල පන්සලට යන බෝධිය පසුගිය ආපදා කාලයේදී කඩාවැටිලා තිබුනා. ඒක පිළිසකර කිරීමට අපි උදව් කරන්නම් කීවාට ඒ අවස්ථාවේදී හමුදාවෙන් පිරිස ලබාගෙන එම පිළිසකර කිරීම් කලා. කාණු කැට අපෙන් ඉල්ලා තිබුණා. නමුත් ඒ අදාල කාණු කැට අපි ළඟ තිබුණේ නෑ. ඒකටත් වතුර බැස්ම ඒ අය සකස් කරගෙන තිබුනා. අපිට ඒ වෙලාවේ කිසිම උදව්වක් කරන්න ලැබුනේ නෑ. දැන් ස්වාමීන් වහන්සේ ඉල්ලන්නේ පාර හදලා ඉවරයි, කුඹුරට වැටිලා තිබෙන ගල් ටික උඩට අරගන්න JCB යන්ත්‍රය ලබා දෙන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, පිළිසකර කරමින් තිබෙන නුගවෙල පුරාණ විහාරස්ථ බෝමළුවට යන මාර්ගයේ, වෙලට කඩාවැටුන ගල්බැම්මේ සුන්බුන් ඉවත් කරගැනීම සඳහා අප සභාවේ JCB යන්ත්‍රය එක් දිනකට ලබා දීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පිළිසකර කරමින් තිබෙන නුගවෙල පුරාණ විහාරස්ථ බෝමළුවට යන මාර්ගයේ, වෙලට කඩාවැටුන ගල්බැම්මේ සුන්බුන් ඉවත් කරගැනීම සඳහා අප සභාවේ JCB යන්ත්‍රය එක් දිනකට ලබා දීම සුදුසු බවට තීරණය විය.

**3.10** <u>මාර්ග අංකයක් ලබා ගැනීම.</u>

නවතල්වත්ත කොට්ඨාශයේ, නවතල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ ගැමුණු මයාගේ වෙල් යාය ඉදිරිපිට පන්සල් වත්තට යන මාර්ගය ගැසට් කර අංකයක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය**

ගරු සභාපතිතුමියනි, මේ මාර්ගය ගැසට් කරලා නැති නිසා මාර්ගය ගැසට් කරගන්න කියලා දැනුම් දීලා ගියා. ඒ නිසයි මම ඔය ඉල්ලීම් ලිපිය ඉදිරිපත් කලේ ගිය සතියේ කුරුණෑගලින් ඇවිත් බලලා, මුදල් ප්‍රතිපාදන යොදවලා මාර්ගය සංවර්ධනය කරන්න සුදුසුයි කියලා කිව්වා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රිනි කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, නවතල්වත්ත කොට්ඨාශයේ නවතල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ ගැමුණු මයාගේ වෙල් යාය ඉදිරිපිට පන්සල් වත්තට යන මාර්ගය ගැසට් කර අංකයක් ලබාදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගැමුණු මහත්මයාගේ නිවස අසලින් වෙල්යාය ඉදිරිපිට පන්සල් මාර්ගයට ඉඩමෙන් තව අඩියක පමණ ප්‍රමාණයක් ලබා දෙනවා. ඒක හොඳ දෙයක් අනාගතයට. මේ පාරවල් සභාවට පවරා ගන්න යනකොට ප්‍රශ්න එනවා. ඒ නිසා දැන්ම ඒ දේවල් විසඳගන්න. එතුමිය ඉදිරිපත් කරලා තිබෙන ඒ යෝජනාව අපි ස්ථිර කලාමත් නීත්‍යානුකූලභාවයක් තිබෙනවා. ඔය වගේම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයෙනුත් මුදල් වෙන් කරපු කාලයක් තිබුනා. ඒ කාලය පුද්ගලික පාරවලුත් කොන්ක්‍රීට් කරලා තිබුණා. අපි සභාවෙනුත් මුදල් ප්‍රතිපාදන වෙන් කරන විට ඒ පාර සභාවට අයිති පාරක් ද කියලා හොයලා බලලා මුදල් ප්‍රතිපාදන වෙන් කරන්න ඕනෑ. ඒ වගේම ඔය පිළිබඳ සමීක්ෂණයක් කරලා ඒවා ප්‍රාදේශීය සභාවට අයිති ද නැද්ද කියලා හොයලා බලන්න ඕනේ. ගැසට් එකට යන එක තමයි හොඳම දේ. ඒ වගේම පසුගිය කාලේ ලේකම්තුමිය ඇතුළු නිලධාරි මණ්ඩලය හොඳ වැඩක් කලා. මාර්ග 700 ක් පමණ ප්‍රමාණයක් මැනලා ගැසට් කරලා තිබෙනවා. සමහර පාරවල් තිබෙනවා ලේඛනගත වෙලා නොමැති ඒවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය සභා වාරයේදී දැනුම් දුන් පසු ගමේ අයත් එක්ක සාකච්ඡා කළාම දැනගන්න ලැබුණා මගහැරුනු මාර්ග තිබෙනවා. ගමක මාර්ගයක තිබෙන නීත්‍යානුකූලභාවය ආරක්ෂා කරන්න අපි හැමෝම දැනගන්න ඕනෑ. ඉදිරියේදී අපි නැතත් ඉන්න අයට ප්‍රයෝජනයක් ගන්න අපි ඒවා සකස් කළ යුතුයි. ඒ නිසා මේ මාර්ග ලේඛනගත කිරීමේ දී ඒ මාර්ග හඳුනාගෙන

නිවැරදි කරගන්න අවස්ථාව ලබා ගන්න කියලා ඔබතුමාලාගෙන් ඉල්ලා සිටිනවා. මගේ කොට්ඨාශයේ එවැනි මාර්ග ලැයිස්තුවක් මම සටහන් කරගෙන ආවා. මම ඒක සභාගත කරනවා.

**පාරවල් හා පටු මාවත් මැනුම් කිරීමේදී මගහැරී ඇති මාර්ග හා වැරදි ලෙස සඳහන් වී ඇති මාර්ග පිළිබඳ විස්තර**

වැරදි ලෙස සඳහන් වී ඇති මාර්ග පහත සඳහන් ලෙස නිවැරදි විය යුතුව ඇත.

| අනු අංකය | මාර්ග අංකය | මාර්ගයේ නම |
|---|---|---|
| 290 | NWP ALP C 05 / 9 | ගල්ගමුව සිට බෝයවලාන දක්වා මාර්ගය |
| 318 | NWP ALP C 05 / 9 / 7 / 1 | බෝයවලාන මැද්දහේන මාර්ගය |
| 556 | NWP ALP B9 / 40 / 5 / 1 | බෝගමුව මහයාය මාර්ගය |
| 604 | NWP ALP B9 / 52 | බෝයවාලන නගරය මැදින් ඇති පඹේගෙදර දක්වා ඇති මාර්ගය |
| 675 | NWP ALP D 03 / 1 | නැබඩවතුර බෝගමුව හරහා ඕතර කිරුවන්පොල මාර්ගය |
| 680 | NWP ALP D 03 / 6 | නැබඩවතුර තලගොල්ලවත්ත හරහා බෝගමුව දක්වා ඇති පැරණි ගම් සභා මාර්ගය |

මගහැරී ඇති මාර්ග - අංක 1028 නැබඩවතුර ග්‍රාම නිලධාරී වසම

| අනු අංකය | මාර්ගයේ නම |
|---|---|
| 1 | නැබඩවතුර ආඳාවෙල කුඹුරු යාය දක්වා ඇති කෘෂිකාර්මික මාර්ගය |
| 2 | නැබඩවතුර කුඹුරු යාය දක්වා ඇති 2 වැනි කෘෂිකාර්මික මාර්ගය |
| 3 | නැබඩවතුර පිටකොටුව කුඹුරු යාය දක්වා ඇති 3 වැනි කෘෂිකාර්මික මාර්ගය |
| 4 | බෝගමුව හිරිකුඹුර හරහා ඕතර කිරුවන්පොල මාර්ගය |
| 5 | නැබඩවතුර මිල්ලගහමුල මාර්ගය |
| 6 | පැපොල්ගස්සින්න වත්ත ජනපදයේ ආරම්භක ස්ථානයේ සිට බෙහෙත්වත්ත හරහා පහළගම මාර්ගය |
| 7 | පැපොල්ගස්සින්න වත්ත ජනපදයේ 1 වැනි අතුරු මාර්ගය |
| 8 | පැපොල්ගස්සින්න ජනපදයේ 2 වැනි අතුරු මාර්ගය |
| 9 | පැපොල්ගස්සින්න වත්ත ජනපදයේ බෙහෙත්වත්ත ඉදිරිපිටින් දිවෙන 3 වැනි අතුරු මාර්ගය |
| 10 | නැබඩවතුර පහළගම මාර්ගයේ පඹේගෙදර අතුරු මාර්ගය |

| | |
|---|---|
| 11 | නැබඩවතුර පහළගම මාර්ගයේ කටුහේන කෘෂිකාර්මික මාර්ගය |
| 12 | නැබඩවතුර කැව්මිගල හරහා පහළගම මාර්ගය |
| 13 | නැබඩවතුර කැව්මිගල හරහා පහළගම මාර්ගයේ 1 වැනි අතුරු මාර්ගය |
| 14 | නැබඩවතුර මැදිලන්දහේන රජයේ ඉඩම හරහා දිවෙන කෘෂිකාර්මික මාර්ගය |
| මගහැරී ඇති මාර්ග - අංක 1029 බෝයවලාන ග්‍රාම නිලධාරී වසම | |
| අනු අංකය | මාර්ගයේ නම |
| 1 | බෝයවලාන නව ජනපදයේ 1 වැනි අතුරු මාර්ගය |
| 2 | බෝයවලාන ගල්ගමුව මාර්ගයට සම්බන්ධව ආරම්භ වන බෝයවලාන කැන්දගොල්ල අතුරු මාර්ගය |
| 3 | බෝයවලාන පරගහකුඹුර අස්වැද්දුම අතුරු මාර්ගය |
| මගහැරී ඇති මාර්ග - අංක 1009 කැප්පිටිවලාන ග්‍රාම නිලධාරී වසම | |
| අනු අංකය | මාර්ගයේ නම |
| 1 | අලපලාව මාර්ගයේ සිට සුසාන භූමියට ප්‍රවිශ්ඨ මාර්ගය |
| 2 | අලපලාව මාර්ගයේසිට අළුත්වත්ත දක්වා ඇති මාර්ගය |
| 3 | අලපලාව මාර්ගයේ සිට කපිල චන්දන නිවස දක්වා ඇති අතුරු මාර්ගය |
| 4 | අලපලාව ප්‍රධාන මාර්ගයේ සිට අලපලාව වත්ත හරහා වෙල්යාය දක්වා ඇති කෘෂිකාර්මික මාර්ගය |
| 5 | කැප්පිටිවලාන 4 කණුව ඉදිරිපිටින් ඇති අතුරු මාර්ගය |
| 6 | කැප්පිටිවලාන නෙල්ලිගහමුල අතුරු මාර්ගය |
| 7 | කැප්පිටිවලාන ඇල ගාව වත්ත අතුරු මාර්ගය |
| 8 | කැප්පිටිවලාන හිඳහේන වෙල්යාය දක්වා ඇති කෘෂිකාර්මික මාර්ගය |
| 9 | හිඳහේන කොස්ගහමුලවත්ත අතුරු මාර්ගය |
| 10 | වැලිහිඳ පරගහමුලවත්ත මාර්ගය |
| 11 | පරගහමුලවත්ත මාර්ගයේ සුසාන භූමියට යන අතුරු මාර්ගය |
| 12 | කැප්පිටිවලාන පන්සල මාර්ගයේ පරගහමුල පාරට වැටෙන අතුරු මාර්ගය |
| 13 | පරගහමුල මාර්ගයේ අන්නෑවත්ත අතුරු මාර්ගය |

| | |
|---|---|
| 14 | පරගහමුල මාර්ගයේ සිට අන්නෑවත්ත අතුරු මාර්ගය 2 |
| 15 | වැලිහිඳ සමරක්කොඩි වත්ත අතුරු මාර්ගය 2 |
| 16 | වැලිහිඳ 5 කණුව අසලින් ආරම්භ වන මීපිටිගෙදර ගම්මානයට යන අතුරු මාර්ගය |
| 17 | අලපලාව පාරේ සිට ලිඳ කොටුව දක්වා දිවෙන අතුරු මාර්ගය |

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

ගිය සභාවේදී මතක් කලා ගැසට් කරන ලද මාර්ග පිළිබඳව. ඒ වගේම ප්‍රදේශවාසීන් සමඟ සාකච්ඡා කරලා මගහැරුනු මාර්ග තිබෙනවා නම්කරලා දෙන්න කියලා. ඒවගේම හැම කොට්ඨාශවලටම සිතියමකුත් තිබෙනවා. අවශ්‍ය කෙනෙක් ඉන්නවනම් සිතියමේ පිටපතක් මෙහෙන් ඉල්ල ගන්න පුළුවන්. මම හිතනවා වඩා වැදගත් ඒකත් අරගෙනම අර ලේඛනය බැලුවා නම්. එහෙම බලලා මගහැරුනු මාර්ග තිබෙනවානම් කඩිනමින් ඒවා සභාවට ලබා දෙන්න. සතියක් ඇතුලතවත් ලබා දුන්නොත් ඉදිරියේ දී කවුරුන් හෝ ක්‍රියාත්මක කරවයි. ඒ නිසා ඒ ගැන වැඩි අවධානය යොමු කරන්න කියලා ඔබතුමන්ලාගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේවගේ තිබෙනවා කෘෂිකාර්මික මාර්ග කියලා. ඒවා තමා පහුවෙනකොට මහා මාර්ග වෙලා ආවේ. මේවා සංවර්ධනය කරන්න ගියාම එක්කෝ අපිට උසාවි යන්න වෙනවා. ගැසට් වෙලා නෑ කියලා කියනවා. නමුත් ඒවා ජනතාව පරිහරණය කරන මාර්ග. ගිය මහා සභාව දවසේ අපි සියලු දෙනාටම ලේඛනයක් ලබා දුන්නා, ජූලි 20 වැනිදා වෙනකොට මගහැරුනු මාර්ග තිබෙනවා නම් ඒ පිළිබඳව තොරතුරු ලබාදෙන්න කියලා. ස්තුතිවන්ත වෙනවා, පාරවල් 700 ගණනක් මැණුම් කරලා තිබෙනවා. ඒ වගේම අතහැරුනු මාර්ගත් තව බොහොමයක් ඇති. ඉක්මනින් මේ තොරතුරු ලබා දුන්නොත් විෂය නිලධාරීන්ට පහසුවක් වේවි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ මාර්ග වලට අලුතෙන් නම් ඇතුලත් කරලා තිබෙනවා. පළමු හරස් වීදිය දෙවන හරස් වීදිය ආදී ආකාරයට. නමුත් ඒ විදිහට ගම්වල භාවිතා කරලා නෑ. ඒ නිසා ඒ පාරවල් වල නාම පුවරුවක් හරි සකස් කරලා ඒක දැන ගැනීමට සලස්වන්න කියලා මම ඉල්ලා සිටිනවා.

ඒ අනුව නවතල්වත්ත කොට්ඨාශයේ, නවතල්වත්ත ග්‍රාම නිලධාරී වසමේ ගැමුණු මයාගේ වෙල් යාය ඉදිරිපිට පන්සල් වත්තට යන මාර්ගය ගැසට් කර අංකයක් ලබා දීම සුදුසු බවත් ගරු එස්.එම්.ජයතිලක මැතිතුමා විසින් යෝජනා කරන ලද පාරවල් හා පටු මාවත් මැනුම් කිරීමේදී මගහැරී ඇති මාර්ග හා වැරදි ලෙස සඳහන් වී ඇති මාර්ග ගැසට් කිරීම සුදුසු බවටත් තීරණය විය.

**3.11 <u>අලව්ව ප්‍රාදේශීය සභාව වෙත ආපසු මාර්ග භාරගැනීම පිළිබඳව වූ වාර්තාව.</u>**

රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයේ රට හදන සෞභාග්‍යයේ දැක්ම යටතේ ජාතික ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කි.මී. 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීම යටතේ අලව්ව පදේශීය සභාව වෙත ආපසු මාර්ග භාරගැනීම පිළිබඳව වූ වාර්තාව තාක්ෂණ නිලධාරී විසින් ඉදිරිපත් කර ඇත. එම වාර්තාව ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාගේ දැනගැනීම සඳහා ඉදිරිපත් කරමි.

| රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයේ රට හදන සෞභාග්‍යයේ දැක්ම යටතේ ජාතික ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කි.මී. 100,000 ක විකල්ප මාර්ග පුනරුත්ථාපනය කිරීම යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව වෙත ආපසු මාර්ග භාරගැනීම පිළිබඳව වූ වාර්තාවයි. | | |
|---|---|---|
| අනු අංකය | මාර්ගයේ නම | මාර්ගයේ වර්තමාන තත්වය හා භාරගැනීමට සුදුසු / නුසුදුසු බව |
| 1 | පන්නල සමිති ශාලාව ළඟ සිට උඩුමුල්ල දක්වා මාර්ගය (0+000 - 1+175) | මාර්ගය ආරම්භ කොටස මීටර් 5 ක් පමණ කොන්ක්‍රීට් කර ඇති අතර ඉතිරි කොටස කාපට් යොදා සංඥා හා මාර්ග සලකුනු කර ඇත. මාර්ගයේ හානි නැත. භාරගැනීම සුදුසුයි. |
| 2 | කන්දේගෙදර තුන්මං හන්දියේ සිට කපුහේනකන්ද මාර්ගය මාර්ගය ( 0+000 - 1+000) | මාර්ගය කාපට් අතුරා මාර්ග සංඥා සහ මාර්ග සලකුණු කර ඇත. මාර්ගයේ හානි නැත. භාරගැනීම සුදුසුයි. |
| 3 | කන්දේගෙදර ගලහිටියාව හරහා විල්ගමුව මාර්ගය (0+000 - 1+000) | මාර්ගය කාපට් අතුරා මාර්ග සංඥා සහ මාර්ග සලකුණු කර ඇත. මාර්ගයේ හානි නැත. භාරගැනීම සුදුසුයි. |
| 4 | රූනගල පන්සල සිට අධිවේගී මාර්ගය අසල පහලවත්ත මාර්ගය මාර්ගය (0+000 - 1+040) | මාර්ගයේ ස්ථාන කීපයක් පිපිරුම් තිබී ඇති අතර ඒවා යථා තත්වයට පත්කොට ඇත. කාපට් කර මාර්ග සංඥා සහ මාර්ග සලකුණු කර ඇත. භාරගැනීම සුදුසු වේ. |
| 5 | පී.බී.වැත්තෑව මාර්ගය (0+000 - 2+420) | මාර්ගය කාපට් අතුරා හා කොන්ක්‍රීට් කර ඇත. ආපදා නැත. ආපසු භාරගැනීම සුදුසුයි. |
| 6 | තිබ්බටුගොල්ල විල්ගමුව මාර්ගය (0+000 - 2+000) | කාපට් අතුරා ඇත. හානි නැත. ආපසු භාරගැනීම යෝග්‍යයයි. |
| 7 | හාල්පන්දෙණිය හැඩිපන්නල මාර්ගය (0+000 - 0+080) ( 0+200 - 2+000) | මෙම මාර්ගයේ කාපට් අතුරා ඇත. ස්ථාන කීපයක Crack Sealing කර ඇත. මාර්ගය ආපසු භාරගැනීම යෝග්‍ය වේ. |
| 8 | හාල්පන්දෙණිය හැඩිපන්නල මාර්ගය (0+080 - 0+200) | මෙම මාර්ග කොටස කොන්ක්‍රීට් කිරීමට යෝජිතව තිබූ නමුත් බොරළු දමා තලා ඒ මත ABC අතුරා තලා තිබුණි. දැඩි වර්ෂාව නිසා එම කොටස සෝදා පාළුවට පත්ව ඇත. කොන්ක්‍රීට් කිරීම සිදු කොට නොමැත. ආපසු භාරගැනීම යෝග්‍ය නොවේ. |

| | | |
|---|---|---|
| 9 | පඹදෙණිය කොස්සින්න මාර්ගය<br>(0+000 - 2+000) | මෙම මාර්ගය කාපට් කිරීම සහ කොන්ක්‍රීට් කිරීම සිදු කොට ඇත. බුදුමැදුර දෙස සිට මීටර් 200 ක් පමණ දුරක් දක්වා මාර්ග තලය මත පිපිරුම් දක්නට ඇත. මෙම කොටස Crack Sealing කර මාර්ගය යථා තත්වයට පත්කල යුතුවේ. මෙම මාර්ගය ප්‍රයෝජනයට ගෙන ගල්වලවල් දෙකක් පවත්වාගෙන යාම සඳහා රුදවුම් මුදල් තැන්පත් කොට ඇත. මෙම මාර්ග කොටස යථා තත්වයට පත් කිරීමට මාර්ග සංවර්ධන අධිකාරියෙන් ඇස්තමේන්තු ලබාගෙන Crack Sealing කර මාර්ගයේ වැඩ නිමකොට පළමුව රුදවුම් මුදල තැන්පත් කල අයගෙන් හානිපූර්ණය කර ඉතිරි මුදලක් ඇත්නම් ආපසු ගෙවීම හෝ ප්‍රතිසංස්කරණය සඳහා මුදල ප්‍රමාණවත් නොවේ නම් ඔවුන්ගෙන් අයකර ගැනීම සුදුසු බව වාර්තා කරමි. සුදුසු තීරණ සඳහා ඉදිරිපත් කරමි. |
| 10 | හිත්තරපොල මල්දෙණිය මාර්ගය<br>(0+000 - 1+000) | මෙම මාර්ගය කාපට් අතුරා මාර්ග සංඥා සහ මාර්ග සලකුණු කොට ඇති අතර පන්සල අසල කොටසේ ස්ථාන කීපයක් Crack Sealing කර ඇත. වෙනත් ආපදා නැත. මාර්ගය ආපසු භාර ගැනීම යෝග්‍ය වේ. |
| 11 | අලව්ව පළමු සැතපුම් කණුව මාර්ගය<br>(0+000 - 1+000) | මෙම මාර්ගයේ අළුතින් තනන ලද බෝක්කුව දක්වා මීටර් 25 ක් පමණ කොන්ක්‍රීට් යෙදීමට තිබුණද එය සිදු කොට නැත. |
| | | අළුතින් තනන ලද බෝක්කුවේ ගාඩ් ගල් 04 ක් යෙදීමට ඇත. |
| | | කාපට් කරන ලද මාර්ග කොටස යහපත් තත්වයේ පවතී. එබැවින් කාපට් යෙදූ මාර්ග කොටස භාරගැනීම සුදුසු අතර බෝක්කුවේ ගාඩ් ගල් යෙදීමෙන් අනතුරුව භාරගැනීම සුදුසු වේ. |
| 12 | අලව්ව පළමු සැතපුම් කණුව අසල සිට ගොරොක්ගස්දෙණිය මාර්ගය<br>(0+000 - 1+160) | මෙම මාර්ගයේ ප්‍රධාන වශයෙන් කාපට් කිරීම සම්පූර්ණ කර ඇති අතර කොන්ක්‍රීට් කිරීමද සිදුකොට ඇත. |
| | | මාර්ගය යහපත් තත්වයේ පවතී. ආපසු භාරගැනීම සුදුසුවේ. |
| 13 | පොරමඩල වලකුඹුර මාර්ගය<br>(0+000 -2+230) | ඇස්තමේන්තුවට අදාල කොටසේ කාපට් කිරීම සිදුකොට ඇති අතර එහි ආපදා නොමැත. එහෙත් පහත සඳහන් අඩුපාඩු පවතී |
| | | තැලවිල්ල මතුපිට කොන්ක්‍රීට් කිරීම සිදුකොට නැත. |
| | | තැලවිල්ලේ ජලය පිටවන දෙසින් ඇති කඩය අසල පැතිබැම්ම මීටර් 10 ක පමණ දුරක් කම්බි යොදා ඇති අතර කොන්ක්‍රීට් කිරීම සිදුකොට නැත. |
| | | මාර්ගයේ ස්ථාන 02 ක මීටර් 20 බැගින් වර්ෂාව නිසා මාර්ග උරහිස සෝදා පාළුවට ලක්ව ඇත. |
| | | සුදුසු පියවරක් ගැනීම සඳහා වාර්තා කරමි |
| 14 | කපුවරල පන්සල පාර<br>(කි.මී. 1.2 , 0.2) | මෙම මාර්ගය කාපට් අතුරා තනා නිමකොට ඇත. ආපදා නැත. ආපසු භාරගැනීම සුදුසු වේ. |

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

රාජ්‍ය ප්‍රතිපත්ති ප්‍රකාශයේ රට හදන සෞභාග්‍යයේ දැක්ම යටතේ ජාතික ප්‍රාදේශීය හා ග්‍රාමීය වශයෙන් කි.මී 100,000 ක විකල්ප මාර්ග පුනරුත්තාපනය කිරීම යටතේ අලව්ව ප්‍රාදේශීය සභාව වෙත ආපසු භාරගන්න කියලා තිබෙන මාර්ග තාක්ෂණ නිලධාරිතුමාට පරික්ෂා කරල තොරතුරු ලබා දීල තිබෙනවා. නාමල් ශෂිකාන්ත තාක්ෂණ නිලධාරිතුමා බලපු මාර්ග ටික කර්මාන්ත කමිටුවට ඉදිරිපත් කර තිබෙනවා. තාක්ෂණ නිලධාරි වඩිනමුණ මහතාගේ ටික ඊයේ RD ඒකේ ප්‍රධාන ඉංජිනේරුතුමා ඇවිල්ල සාකච්ඡා කරල ඒ අයත් ඒක්කම ගිහිල්ල බලලා තමයි මේ වාර්තාව ඉදිරිපත් කරල තිබෙන්නෙ. අපි අඩුපාඩු තිබෙන පාරවල් හා සම්පූර්ණ වැඩ ඉවර පාරවල් මොනවද කියල වාර්තාවක් ඒ අයට ලබා දීල භාරගන්නවා නම් හොඳයි කියලයි ඒ අය දැනුවත් කලේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි කියුබ් 2 වාහන ධාවනය කරන්න කිව්වට ඒ අය එහෙම කරන්නෙ නෑ. අපි මේ හැම පාරකම කියුබ් 2 වාහන පමණයි කියල බෝඩ් එක ගහන්න වෙනවා. ඊලගට දැව එලීමේ බලපත්‍ර නිකුත් කරලා ඒ කටයුතු කලාට, අපිට මේ ප්‍රාදේශීය සභාව සතු බලතල තිබෙනවා. අපි මේ සභාවේ තිරණයක් ගන්න ඕනෑ මේ කඳන් කපන ව්‍යාපාරිකයොත් එක්ක සාකච්ඡා කරල හරි. මොකද අපේ බල ප්‍රදේශයේම ජීවත් වෙන අය. වෙන ප්‍රදේශවලින් එන්නෙ නෑ මෙහෙ ව්‍යාපාර කරන්න. ඒ අයට කඳන් කීපය කීපය ගෙනල්ල ප්‍රධාන පාර අයිනෙ ගොඩගහල පස්සෙ ඒක පටවලා ගෙනියන්න කියල හානියක් නොවෙන්න. පාරවල් සම්බන්ධව මේ සභාවෙ යම් කිසි මුදලක් යයි. බෝඩ් එකත් පාර ආරම්භ කරන ස්ථානයේයි, පාර අවසාන කරන ස්ථානයේයි ගැහුවොත් ගමේ පාර පාවිච්චි කරන අයට පුළුවන් වෙනවා ටිපර් එකක් යනකොට ඒක නතර කරල මේක ප්‍රවාහනය කරන්න එපා සභාවේ නීතියක් තියනව කියලා කියන්න. ඒ ගැනත් ඔය එක්කම සැලකිලිමත් වෙන්න කියන ඉල්ලීමක් කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, සමහර පාරවල් වල බෝක්කු ටික හරියට දාල නෑ. පස් පුරවල නෑ. ඒ වගේ දේවල් තිබෙනවා. මේ වැඩේ සාර්ථක නෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, විල්ගමුවෙත් කාපට් කරපු පාරක තේක්ක කැලේ කපල කොට ලොරි යනවා. ඒ අය දැනුවත් කලාට තවම ඒක නැවතිලා නෑ. දැනුවත් කලාට ඒ අය කියන්නෙ බෝඩ් එකක් නෑ කියලා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, රජයෙන් මහා මාර්ග අමාත්‍යාශය හරහා කාපට් කරල අපිට ආපසු අරගන්න කියල තියන එක හොඳයි. පළමුවෙන්ම අපි ගම් මට්ටමෙන් ප්‍රාදේශීය සභා පාරවල්වල කාපට් දැමීම සම්බන්ධව තීන්දුව ගත්තෙ හිටපු ජනාධිපති ගෝඨාභය රාජපක්ෂ මැතිතුමා. එතුමා තමයි කිලෝමීටර් ලක්ෂයක් කාපට් කිරීමේ වැඩපිළිවෙලේදී අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයෙත් දඹදෙණිය ආසනයටත් ප්‍රාදේශීය සභා පාරවල් ගණනාවකට කාපට් ආවේ. හොඳ දෙයක් මේ පාරවල් ආරම්භයේදී හොඳින් වැඩ කරගෙන ගියා. මගේ කොට්ඨාශයේ හැඩිපන්නල ඉඳලා හඟවත්ත දක්වා 2 km ක් කාපට් කරල අවසන් කරල තිබෙනවා. එතනදී හාල්පන්දෙණියෙ ඉඳල 200m ක් වෙල්යාය තිබෙනවා. එතනදී කාපට් එකට ගල් අතුරනකොට තද වැස්සක් ඇවිල්ල සම්පූර්ණ ගල් හෝදගෙන වෙලට ගියා. ඊට පස්සෙ කාපට් ඒක නැවතුනා. ඊට පස්සෙ කොන්ක්‍රීට් දාන්න ඕනෑ කියන මතකයක් හැදුවා. ඊට පසුව ඒ සඳහා මහා මාර්ග අධිකාරිය කුරුණෑගල කාර්යාලයේ තාක්ෂණ නිලධාරින්, ඉංජිනේරුවන් තමයි මූලික වෙලා හිටියෙ. කොන්ක්‍රීට් දාන්නත්

ලක්ෂ 30 ක් හෝ 40 ක් ඇස්තමේන්තු හදල යැව්වා. යවලා අපිත් කතා කරගෙන යනකොට තමයි ඒක දැන් නැවතිලා තිබෙන්නෙ. දැන් ඒ පාර කලින් තිබුණ විදියටම තමයි තිබෙන්නෙ. මේ ටික එක්කො කාපට් වෙන්න ඕනැ. නැත්නම් කොන්ක්‍රීට් වෙන්න ඕනැ. මේක රජයට, මහා මාර්ග අමාත්‍යාංශයට දන්වලා මේක කඩිනම් කරල දෙන්න කිව්වොත් අංග සම්පූර්ණ වෙනවා. ඊලගට පොරමඩල පාරත් වළකුඹුර පැත්තෙනුත් දෙකම ඒකාබද්ධ වෙන විදිහට තමයි පාර දිල තිබෙන්නෙ. වළකුඹුරෙන් කොහොලාන හරියෙන් ප්‍රියන්ත මන්ත්‍රීතුමාලගෙ ගෙවල් පැත්තෙන් තෙල් මෝල ලගින් වළකුඹුර පන්සල පැත්තෙන් පොරමඩලට එනව. ඊලගට පොරමඩල කන්දෙකුඹුර පන්සල හන්දියේ ඉදල ඔය පාරවල් දෙක ඒකාබද්ධ වෙන විදිහටම ඔය පාරවල් ඒකාබද්ධ වෙලා තිබෙනවා. ඒකෙත් පොරමඩලෙ චමින්ද මන්ත්‍රීතුමාගෙ පරණ ගෙවල් තිබෙන හරියෙ වෙල්යාය ලගත් ඔය ප්‍රශ්නය ආවා. ඒ ටිකත් පාර හැදිල නෑ. මේ ප්‍රශ්න දෙක අපේ කොට්ඨාශයේ තිබෙනවා. බල ප්‍රදේශයේ ගොඩක් තැන්වල ඔය වගේ පොඩි පොඩි කාරණා තිබෙනවා. මේ කාරණයත් ඒක්ක ඔබතුමිය ලිපියක් යවන්න මේ මාර්ග භාරගන්න පුළුවන්, අඩුපාඩු ටිකත් අංග සම්පූර්ණ කරල දෙනවනම් හොඳයි. එහෙම බැරිනම් භාරගන්න ගැටළුවකුත් නෑ. මොකද අපේ සභා පාරවල්. ඊලගට මෙතුමලා කියපු කාරණාව. කියුබ් 3, 4 ටිපර් යනවා. මේව නිරන්තරයෙන් වෙන දේවල්. මේවට බෝඩ් ගැහුවත්, නීතියෙන් කටයුතු කලත් කොහොම හරි කරගන්න පුළුවන් කෙනා ඕනැ විදිහට කරනවා. මේකෙදිත් අපි දැඩි ස්ථාවරයක, දැඩි නීතියක ඉන්නවා නම් කොට අදින්නෙ නෑ. එහෙමනම් අපට පාරවල් රැකගන්න පුළුවන්. පසුගිය කාලෙත් කොන්ක්‍රිට් දාපු පාරවල් කැඩිල තිබෙන්නෙ ඒ ටිපර් ගිය නිසාම තමයි. මේවට අපි සභාවක් හැටියට සෑම සභාවකම දැඩි තීන්දුවක ඉන්නව නම් එහෙම කොට අදින්න බෑ. ඒ නිසා නඩුවක් දෙකක් හරි දාල මේව නවත්වන්න ඕනැ. එතකොට ඕක බොහෝ දුරට නවතියි. වැදගත්ම කාරණය තමයි අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අපිට කරගන්න බැරි වුණ කාපට් පාරවල් ගණනාවක් අපේ රජයෙන් ගෝඨාභය රාජපක්ෂ මැතිතුමාගෙ හොඳ දැක්මක් අනුව ගම්වලට ගිය පාරවල් ටික තව ටිකක් හැදුවනම් මම හිතනව තව කෙනෙකුට යන්න පුළුවන්. ඒ කාපට් පාරවල්වල දැන් මිනිස්සු හොඳින් යනවා කියල මතක් කරමින් ඒ වෙලාවෙ කරපු හොඳ ක්‍රියාවලියට අපි ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිතුමාට ස්තුතිවන්ත වෙන්න ඕනැ. මේ පාරවල් ලේඛනය අපි ජනතාවට පවරන්න ඕනැ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපි මීට පෙර සභාවට යෝජනාවක් ගෙනාව පාරවල් වල කොට අදිනව, ගල් අදිනව කෝටි ගණන් වියදම් කරල හදන මේ පාරවල් කැඩෙනවා. ඒ නිසා ටොන් මෙච්චර ප්‍රමාණයකට පමණයි යන්න පුළුවන්. එතනින් එහාට බර වාහන ගමන් කිරීම තහනම් කියලා බෝඩ් ගහන්න කියලා. දැන් ඒවා නෑ. ගම්වල මිනිස්සුත් කියනව බෝඩ් එකක්වත් දාන්න කියල. අපි ඒ යෝජනාව සභාවට ඉදිරිපත් කලා. ඒක මේ දක්වා නම් ක්‍රියාත්මක වෙලා නෑ. අපේ ප්‍රදේශයේ පහලවත්ත පාර දැන් පුපුරල තිබෙන්නේ. ඒ වගේම පාරවල් අංග සම්පූර්ණ කරල දෙනවනම් හොඳයි. කිසිම ක්‍රමවේදයක් නෑ. මේව මහජන බදු මුදල්. මේ පාරවල් හරි ප්‍රමිතියට තියනවද කියල බලල අදාල ආයතන දැනුවත් කරල මේ මාර්ග භාරගන්න කියල ඉල්ලා සිටින අතර මාර්ගවලට බෝඩ් දාන්න කියලත් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මගේ කොට්ඨාශයේත් උඩගන්කන්ද ප්‍රදේශයේ කිලෝමීටර් දෙකක් කාපට් වුණා. ඒකෙත් යම් ප්‍රමාණයක් ඉතුරු උනා. අවශ්‍ය ප්‍රමාණයට දාලා පසුව එකේ කොටසක් සිදු වුණා. මම ඉල්ලීමකුත් කරලා තිබුණා. නමුත් ඒකට තවම මොනවත් සිදු වුණේ නෑ. ඒ පාරේ දැනට හානියක් නෑ. ඒ වුණත් කල්වට් එකක්වත් අළුතෙන් යෙදවූයේ නෑ. උඩගන්කන්ද ප්‍රදේශයේ සිට එන වතුර පාරත් එක්ක පාර සම්පූර්ණයෙන්ම ගලවාගෙන යයිද දන්නෙත් නෑ. උඩගන්කන්දේ ඉඳලා

වැව ගාවට එන වතුර පාර සම්පූර්ණයෙන්ම එතැනට බෝක්කුවක් දාන්න සිදුවෙලා තිබුණා. දැන් වැඩ නවත්තලා තිබෙන නිසා ඒ පාරට යොදවපු මුදල් අපරාදේ වෙයි කියලා හිතනවා. එන වතුර පාර ආයෙ බහින්න දිහාවක් නැතුවම කඩාගෙන යනවා. ඒකට වැඩි අවධානයක් යොමු කරන්න කියලා ඉල්ලනවා. ඒ වගේම ඉතුරු කොටසත් කිලෝ මීටර් තුන්සීයක් හාරසීයක් විතර ඉතුරු වෙලා තිබෙනවා. ඒ ටිකටත් විශේෂ අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මධ්‍යම රජයෙන් කලත් සභා ප්‍රතිපාදන යටතේ කලත් මම හිතන්නේ අපි මහජනතාවගේ බදු මුදල් තමයි මේ එහෙට මෙහෙට කළමනාකරණය කරන්නේ. කෙසේ වෙතත් මේ මාර්ග පද්ධතිය සම්බන්ධයෙන් අපි දිගු කාලයක ඉඳලා සභාවේ හඬක් නඟනවා. මේ කාපට් කරපු පාරවල් වල වැලි ටික, පස් ටික, ගල් ටික අදින එක පිළිබඳව අපි නිතර නිතර කතා කළා. කෙසේ වෙතත් මම හිතන්නේ අපේ රටේ දියුණුවට කරන මේ ක්‍රියාවලිය තුළ මම දකින දේ තමයි මේ මාර්ග පද්ධතිය හැදුවා කියලා, බෝඩ් එකක් හයි කෙරුවා කියලා අපේ රටේ ඉතුරු වෙලා තිබෙන මාර්ග පද්ධතිය හා කර්මාන්ත අඩපන කිරීමේ ක්‍රියාවලියක් වුණා. අපි රටක් විදිහට ආයෝජනයක් කරද්දි, මාර්ග පද්ධතිය හදද්දි ඕනෑ වාහනයක් යන්න පුළුවන් විදිහෙ ප්‍රමිතියකින් යුතු මාර්ගයක් නිර්මාණය කිරීම තමයි මේකට තිබෙන එකම විසඳුම. එහෙම නැතුව බෝඩ් ගහලා කර්මාන්ත වසා දමනවාට වඩා හොඳයි මේකෙ ප්‍රමිතිය හරි ආකාරයෙන් කරලා අපේ රටේ සංවර්ධනය ඉස්සරහට කරගෙන යන්න අවස්ථාවක් සලසා දෙන එක. මේ කටයුත්තෙදි මම දකිනවා මෙතනින් පස්සෙවත් මේ හදන මාර්ග පද්ධතිය පිළිබඳව සහතිකයක් ප්‍රමිතියක් ඇති පාරක් නිර්මාණය කලාද කියන එක පිළිබඳව පසු විපරම් කිරීම හා ඒ කොන්ත්‍රාත්කරුවන් කොන්ත්‍රාත් එක හරියට කළා ද කියන එක පිළිබඳව විමසා සිටීම තමයි මෙතනදි කල යුත්තේ. එහෙම නැතුව කෙනෙක් කර්මාන්තයක් ආරම්භ කරනකොට කර්මාන්තය වහල දාන්නවත් රටේ දියුණුවට කටයුතු කරන විට ඒ අය බැන්ද ඇප මුදල් ටික අපි අයිති කරගෙන ඒ මනුස්සයාට අසාධාරණයක් කරන්නෙවත් නැතුව නිසි ප්‍රමිතියක් ඇතුව ඒ මාර්ග සකස් කරනවා නම් ගැටලුවක් නෑ. මම ඉල්ලා සිටිනවා ඉදිරි වැඩපිළිවෙලේදී මේ මාර්ග පද්ධතිය හදද්දි කොන්ත්‍රාත්කරුවන්ට ගෙවන මුදල් ටිකක් තව වැඩි කරලා හරි කමක් නෑ, පාර පොඩි ප්‍රමාණයක් වුණත් කමක් නෑ, ප්‍රමිතියෙන් යුතු පාරක් නිර්මාණය කිරීමේ වගකීම අපි සභාවක් විදිහට නීතිගත කරමු කියලා මම මේ අවස්ථාවේදී යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඕතර කිරුවන්පොල විහාරස්ථානය අසලින් යනකොට ඒ ආරම්භක ස්ථානයෙන්ම කුට්ටි ගල් ඉවත් කළා. එතන දැන් සෝදා පාළුවට ලක්වෙලා. මම පහුගිය දිනවලත් JCB යන්ත්‍රය ලබා දෙන්න කියලා ඉල්ලීම් කළා. ඒ වගේම මහජන මුදලින් මේ කරන සංවර්ධන කටයුතු නිසි ප්‍රමිතියට අපි කළ යුතුයි. ඒ මොකද සමහර කොන්ක්‍රීට් මාර්ග අද වන විට පුපුරලා. ඕතර කිරුවන්පොල ඒ මාර්ග දෙක සම්බන්ධවත් ඉහළට දැනුවත් කරන ලෙස මම ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඇත්තටම මේ මාර්ග පද්ධතිය හැදුනට පස්සේ අපිට බොහොම පහසුවෙන් යන්න පුළුවන්. මේ ව්‍යාපෘතිවල යම් යම් ගැටලු තිබෙන තැන් තිබෙනවා. නමුත් අපි හදපු පාරවල් ටික රැක ගත යුතුමයි. මොකද නව ව්‍යාපෘති ආරම්භ කිරීමට හැකියාවක් නෑ අපේ රටේ තිබෙන ආර්ථිකයත් එක්ක. අළුත් පාරවල් වලට අනිවාර්යයෙන්ම කියුබ් 2 යි කියලා බෝඩ් එක දාන්න ඕනෑ. මම දැක්ක එක පාරක් තමයි රැනගල පාර. ඒ පාර කොන්ක්‍රීට් එක ගොඩක් තැන්වල පුපුරලා තිබෙනවා. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. අපි කර්මාන්ත රැකගන්න

ඕනෑ කියලා පාරවල්වල යන්න දුන්නොත් මේ පාරවල් ඔක්කොම කැඩිලා විනාශ වෙලා යනවා. ඒ නිසා ඉදිරියට හදන පාරවල් අපි නියමිත ප්‍රමිතියට අනුව හදන්න කියලා ඉල්ලා සිටිමු. අපි පාරවල් ටික ආරක්ෂා කරගන්න නම් හොඳ වැඩපිළිවෙළක් සකස් කරන්න ඕනෑ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ සභාව පැත්තෙනුත් යන ක්‍රමවේදයක් තිබෙනවා. අපි අතුරු ව්‍යවස්ථාවක් සම්මත කරලා තිබෙනවා. ඒ වගේම සභා වාර කිහිපයකදීම අපි තීරණ අරන් තිබෙනවා ගල් වලක් හෝ එවැනි ව්‍යාපාරයක් කරනවා නම් ඒ අදාල ව්‍යාපාරය කරන කෙනා ගිවිසුමක් අත්සන් කරලා ඒ මාර්ගය නඩත්තුවට ඔහුත් දායක කර ගන්නවා. ඒ දෙකම අපි මේ සභාව තුළ කරලා තිබෙනවා. කරන්න පුළුවන්කම තිබෙනවා. විශේෂයෙන්ම ප්‍රමිතියෙන් තොර කියන එක මම පිළිගන්නේ නෑ. ග්‍රාමීය පාරක ගියත්, විශාල වාහන යන නාගරික පාරක ප්‍රමිතියක් ඊටත් වඩා බර වාහන යන ඒවගෙ ප්‍රමිතියත් ඒ අදාල අය නියම ප්‍රමිතියට කරනවා. ගම්බද පාරවල් පිළිබඳව අධ්‍යනය කරලා තමයි කාර්මික නිලධාරි මහත්වරු අපට ලැබෙන ප්‍රතිපාදන යටතේ ඒ ඇස්තමේන්තු සකස් කරන්නේ. මෙම මාර්ග සකස් කරන විට මහජන නියෝජිතයෝ හැටියට අපි කාගේත් වගකීමක් තිබෙනවා මේ කටයුතු පිළිබඳව සොයා බලන්නට. අපේ බල ප්‍රදේශයේ මාර්ග කීපයකම මේ කළු ගල් ව්‍යාපාරය ක්‍රියාත්මක වෙනවා. සෝමසිරි මන්ත්‍රීතුමා කිව්වා වගේ ව්‍යාපාර නවත්වන්න පුළුවන් කමක් නෑ. ඒවා බිහිවෙන්න ඕනෑ. ඒවට අපි අවස්ථාව සලසලා දෙන්න ඕනෑ අපේ නීති රීති පද්ධතිය තුළ. අපි වඩාත් විමසිලිමත්ව මෙතැන් පටන් ඒ ගැන කටයුතු කරන්න අවධානය යොමුකරමු කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ සංවර්ධනය කල මාර්ගවල තිබෙන අතුරු මාර්ගත් යම් ප්‍රමාණයක් කාපට් අතුරා සංවර්ධනය කළ යුතුයි කියලා තිබෙනවා. බොහොමයක් ස්ථානවල ඒ විදිහට සිදු වෙලා නෑ. ඒ පිළිබඳව මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටින ගමන් පංගොල්ල මාර්ගයේ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කළ කොටස කාපට් මාර්ගයේම අතුරු කොටසක් ලෙස කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කළා. ඒ කොන්ක්‍රීට් අතුරා සංවර්ධනය කරපු කොටස නිසි ප්‍රමිතියට සිදුවෙලා නෑ. ඒ අවස්ථාවේම මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කළා. ඒකට අවශ්‍ය වන මුදල් ප්‍රමාණය ඔවුන් නිදහස් නොකරන බව හෝ එසේ නැත්නම් එම කොටසට නැවත කොන්ක්‍රීට් අතුරනවා කියලා ඒ අය පොරොන්දු වුණත් තවම කිසිම දෙයක් වෙලා නෑ. ඒ පිළිබඳවත් මාර්ග සංවර්ධන අධිකාරිය දැනුවත් කරන ලෙස ඉල්ලා සිටිනවා.

ඒ අනුව ඉහත මාර්ග කාර්මික නිලධාරීන් මඟින් පරීක්ෂා කිරීමෙන් අනතුරුව වාර්තා ලබාගෙන පවතින අඩුපාඩු පිළිබඳව අදාල ආයතන වෙත ලිඛිතව දැනුවත් කර ඉන්පසු භාරගැනීම සුදුසු බවට තීරණය විය.

**3.12** <u>ගැසට් පත්‍රයට අනුකූලව නුංගමුව මාර්ගය සීමා මායිම් ලකුණු කර ගැනීම.</u>

අනු අංක 83, කොට්ටවත්ත නුංගමුව මාර්ගයේ හා අනු අංක 139, රනගල පන්සල අසලින් නුංගමුව හරහා මාර්ගයේ වෙල පෙදෙස පමණක් ගැසට් පත්‍රයට අනුකූලව කණු යොදා සීමා මායිම් කර දෙන ලෙස ඉල්ලීමක් කරමින් ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්. චමින්ද වීරවංශ මැතිතුමා විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මේ වෙනකොට නුංගමුව වෙලා යායේ ගොයම් කපලා අවසන් කරලා තිබෙනවා. ඒ පාර ගැසට් කරලා තිබෙන්නේ. ඒ පාර මැනලා වෙන්කරලා දෙන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉහත මාර්ග දෙක ගැසට් පත්‍රයට අනුකූලව මැන, වෙන්කරදීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අනු අංක 83, කොට්ටවත්ත නුංගමුව මාර්ගයේ හා අනු අංක 139, රණගල පන්සල අසලින් නුංගමුව හරහා මාර්ගයේ වෙල පෙදෙස පමණක් ගැසට් පත්‍රයට අනුකූලව කණු යොදා සීමා මායිම් ලකුණු කිරීම සුදුසු බවට තීරණය විය.

**3.13 <u>රුක් රෝපණ වැඩසටහනක් සඳහා පැල ලබා ගැනීම හා JCB යන්ත්‍රය ලබා ගැනීම.</u>**
පහළ වලකුඹුර සිරිපුරවත්ත ඉඩමේ පොදු කටයුතු සඳහා වෙන්කල කොටස දැනට කැලය වැසී ඇති බවත් මීට අමතරව ඊට යාබද ඉඩම් හිමියන් මෙම වෙන්කල කොටස ආක්‍රමණය කරන බව දක්නට ඇති බවත් එබැවින් එම භූමි කොටසෙහි මිනිසාට ආහාරයට ගත හැකි කොස්, දෙල්, අඹ වැනි ශාක සිටුවීම සුදුසු බවට සිරිපුරවත්ත ග්‍රාම සංවර්ධන සමිතියේ මහා සභා රැස්වීමේදී ඒකමතිකව සම්මත වූ බවත් දන්වමින් ශාක සිටුවීම සඳහා JCB යන්ත්‍රය හා පැළ වර්ග ලබා දෙන ලෙස ඉල්ලීමක් කරමින් අංක 162, පහළ වලකුඹුර, අලව්ව ලිපිනයේ සිරිපුර එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය විසින් යොමු කර ඇති ලිපිය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, මම හිතන්නේ සිරිපුරවත්ත ඒ ඉඩම් කැබලි කොටසේ පොදු පහසුකම් සඳහා වෙන්කල කොටසේ යාබද කොටස තිබෙන්නෙත් රජයේ ලබාදීපු ඉඩම් කොටසක්. දැනටමත් එම යාබද කොටසේ පැල ඉනි වැටවල් ඇවිදිමින් පවතිනවා. පොදු පහසුකම් කිව්වට ඒක ගල් තලාවක් තිබෙන්නේ. ඒ සමිතිය ඉල්ලා සිටිනවා කොස්, දෙල්, අඹ වැනි ශාක සිටුවලා එම භූමි ප්‍රමාණය රැක ගනිමු කියලා. ඒ නිසා අපි සභාවක් විදිහට ඒ කටයුතුවලට JCB යන්ත්‍රය සහ පරිසර අංශයේ නිලධාරීන් සම්බන්ධ කරගෙන පැල ටිකක් ලබාගන්න පුළුවන් නම් හා අනෙකුත් පහසුකම් ලබාදීලා, ප්‍රදේශය සුන්දර තැනක් කරලා, අපේ සභාව සතු ඉඩම් ටික අපට ආරක්ෂා කරගන්නට වැඩසටහනක් විදිහට මේ කටයුත්තට අනුමැතිය ලබා දෙන්න කියලා මම ඉතාමත් ගෞරවයෙන් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, ඉහත රුක් රෝපණ වැඩසටහන සඳහා JCB යන්ත්‍රය හා පැළ වර්ග ලබාදීම සුදුසු බව මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, හොඳ යෝජනාවක් කරලා තිබෙන්නේ. ඔබතුමියගේ කාරුණික අවධානය යොමු කරලා JCB යන්ත්‍රය ලබාදෙන්න. ඒ මහත්වරුන්ටත් සම්බන්ධ වෙන්න කියලා ඒ පැල ලබා

දෙන්න පුළුවන් ක්‍රමවේදයකුත් හදාගන්න පුළුවන් නම් හොඳයි. ප්‍රාදේශීය සභාව සතු ඉඩමක් රැකගැනීමට මෙතුමා ගෙනා යෝජනාව ස්ථිර කරන අතර ඔබතුමියගේ කාරුණික අවධානය යොමුකරලා අවශ්‍ය සියලු පහසුකම් ලබා දෙන්න කියන ඉල්ලීම කරනවා. මොකද එය කොළඹ කුරුණෑගල ප්‍රධාන පාර අසල ප්‍රාදේශීය සභාව සතු භූමියක් නිසා.

ඒ අනුව ඉහත රුක් රෝපණ වැඩසටහන සඳහා ලබාදිය හැකි සහයෝගයන් ලබාදීම සුදුසු බවට තීරණය විය.

**3.14** **<u>නුගවෙල විහාරස්ථානයට වතුර බවුසර් දෙකක් ලබා දීම සම්බන්ධව.</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

නුගවෙල විහාරස්ථානයට ජල බවුසර් දෙකක් ලබා දෙන ලෙස ඉල්ලීමක් කර තිබෙනවා. ඒ සම්බන්ධව ඔබතුමන්ලාගේ අදහස් දක්වන්න.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වතුර බවුසර් දෙකක් ඉල්ලලා තිබෙනවා නම් එය ලබා දීම සුදුසුයි කියලා මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම විහාරස්ථානයේ පිරිවෙනකුත් තිබෙනවා. ස්වාමීන් වහන්සේලා 40-50 ක් පමණ එහි වැඩ සිටිනවා. ඒ නිසා වැඩි වතුර ප්‍රමාණයක් අවශ්‍යයි. පායන කාලයට හැමදාම වතුර ප්‍රශ්නය එනවා. ඒ නිසා එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව නුගවෙල විහාරස්ථානයට ජල බවුසර් දෙකක් ලබා දීම සුදුසු බවට තීරණය විය.

**04.** **<u>යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - නැත</u>**

**05.** **<u>යථා පරිදි කල්දී ඇති යෝජනා.</u>**

**(05-01)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/60 - 01 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2022 වර්ෂය දක්වා ක්‍රියාත්මක වන්නේ 2017 වර්ෂයේ සිදු කරන ලද වරිපනම් තක්සේරුව බවත් ඒ අනුව නැවත වරිපනම් තක්සේරුවක් ක්‍රියාත්මක කිරීමේ අවශ්‍යතාවය පැන නැගී ඇති බවත් විෂය නිලධාරී විසින් වාර්තා කර ඇති අතර අලව්ව ප්‍රාදේශීය සභාවේ නව වරිපනම් තක්සේරුව ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ විධානය ලබාගැනීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ වෙලාව සුදුසු වෙලාවක් නෙවෙයි කියලා මම විශේෂයෙන්ම කියන්න කැමතියි. රු.5,000 ක් විතර ගෙවන කෙනාට රු.20,000 ක් විතර ගෙවන්න වුනොත් ඒක ගෙවීමේ අපහසුතාවයක් තිබෙනවා. මේ වරිපනම් ගෙවන හැමෝම කියන්නෑ අපට වරිපනම් බද්ද නිදහස් කරන්න කියලා. බොහෝ පිරිසක් ඒ මුදල ගෙවනවා. එයාලා කියන කතාවක් තමයි මේ අමාරු කාලයක මෙතරම් මුදලක් ගෙවීම අපහසුයි කියන එක. ඒ නිසා මේ යෝජනාව මේ වෙලාවේ නැතුව ලබන අවුරුද්දට ඉදිරිපත් කරමු කියන ඉල්ලීම කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මේ වෙලාවේ මේ යෝජනාව ඉදිරිපත් කිරීම සුදුසු නෑ. මොකද රටේ මිනිස්සු දරිද්‍රතාවයෙන් පෙලෙද්දි බද්දත් වැඩි කරන එක සුදුසු නෑ. මොකද ඒකෙන් ගැටලුකාරී තත්ත්වයක් ඇතිවෙන්න පුළුවන්. අපි මේ අන්තිම මොහොතේ ජනතාව තවත් පීඩාවට පත් කරන යෝජනාවක් ස්ථිර කිරීම මේ වෙලාවේ සුදුසු නැහැ. ඒ නිසා පොඩි පසුබෑමක් කරන්න කියලා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, බදු වැඩි කරලා එහෙම මිනිස්සුන්ට ලැබෙන ප්‍රතිලාභය මොකක්ද කියලා තමයි මගේ තර්කය. අද රජය අපහසුතාවයට පත්වෙලා තිබෙන්නේ. මිනිස්සු කියන්නේ බදු වැඩි කරල බද්දෙන් ගන්න දෙයින් මිනිස්සුන්ට මොනවද ලැබෙන්නේ කියලා. අපි මේ ගැන හොයල බලල කටයුතු කරන්න ඕනෑ. ගිය පාර අයවැයෙන් 87% ක් පුනරාවර්තන වියදම් හා 13% ක් තමයි ප්‍රාග්ධන වියදම්. ජනතාව බලන්නේ සභාවක් විදියට සභාවෙන් මිනිස්සුන්ට මොනවද ලැබෙන්නේ කියලා. මේ අවස්ථාවේදී අපි අඩියක් පස්සට තියලා ඊළඟ සභා වාරයකදී මේ ගැන නැවත සලකා බලමු කියලා ඉල්ලීමක් කරනවා.

ඒ අනුව 2017 වර්ෂයේ සිදුකළ වරිපනම් තක්සේරුව ක්‍රියාත්මක වීම 2022 වසරේ සිදුවූ බැවින් සහ ජනතාව දැඩි ආර්ථික දුෂ්කරතාවයන් වල සිටින බැවින් මේ මොහොතේ නව වරිපනම් තක්සේරුවක් සිදුකිරීම සුදුසු නොවන බවත් එය 2024 වසරේදී සිදුකිරීම සුදුසු බවටත් ඒකමතිකව සහා සම්මත විය.

**(05-02)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/60 - 02 දරණ යෝජනාව</u>**

අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් ස්ථිර පෙර පාසල් 03 හි දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහනක් (වර්තමානයේ ළමා හිංසනය, ළමා අපචාර, මත්ද්‍රව්‍ය භාවිතය සම්බන්දයෙන් හා මනෝවිද්‍යාත්මක උපදේශන වැඩසටහනක් ලෙස) පැවැත්වෙන බැවින් ඊට අදාල පහත වියදම් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| | |
|---|---:|
| චොක්ලට් බිස්කට් පැකට් 04 | 2000.00 |
| සීනි 2kg | 500.00 |
| තේ කුඩු 100g | 250.00 |
| සම්පත්දායක දීමනාව 1500 * පැය 03 | 4500.00 |
| **එකතුව** | 7250.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවට අයත් ස්ථිර පෙරපාසල් 03 හි දෙමාපියන් දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු.7250.00 ක මුදල සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සහා සම්මත විය.

**(05-03)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/60 - 03** දරණ යෝජනාව</u>

ලෝක කාන්තා දිනයට සමගාමීව අලව්ව ප්‍රාදේශිය සභාවේ කාර්යය මණ්ඩලයේ කාන්තාවන් හා අලව්ව බලප්‍රදේශයේ සියළු පෙර පාසල් ගුරු මහත්මීන් වෙනුවෙන් දුරකතන භාවිතා කිරීමේදී සිදුවන ගැටළු සහගත තත්වයන්, දුරකතන අවභාවිතය හා සමාජ මාධ්‍යය භාවිතය තුලින් සිදුවන අකටයුතුකම් සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහනක් 2023.03.16 දින අලව්ව ප්‍රජා ශාලාවේදී පැවැත්වීමට කටයුතු කර ඇත. එබැවින් ඊට අදාල පහත වියදම් ඇස්තමේන්තුව සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට යෝජනා කරමි.

| | |
|---|---|
| චොක්ලට් බිස්කට් පැකට් 05 | 2500.00 |
| සීනි 2kg | 500.00 |
| තේ කුඩු 100g | 250.00 |
| සම්පත්දායක දීමනාව දිවා ආහාරය | 1500.00 |
| **එකතුව** | 4750.00 |

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ලෝක කාන්තා දිනයට සමගාමීව අලව්ව ප්‍රාදේශිය සභාවේ කාර්යය මණ්ඩලයේ කාන්තාවන් හා අලව්ව බල ප්‍රදේශයේ සියළු පෙරපාසල් ගුරු මහත්මීන් වෙනුවෙන් දුරකතන භාවිතා කිරීමේදී සිදුවන ගැටළු සහගත තත්වයන්, දුරකතන අවභාවිතය හා සමාජ මාධ්‍යය භාවිතය තුලින් සිදුවන අකටයුතුකම් සම්බන්ධව දැනුවත් කිරීමේ වැඩසටහන සඳහා වියදම් ඇස්තමේන්තුව වන රු.4750.00 ක මුදල සඳහා අනුමැතිය ලබා දීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-4)**<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක **06/60 - 04** දරණ යෝජනාව</u>

හෝටල්, ලැගුම්හල් සහ නිවාඩු නිකේතන වැනි ව්‍යාපාරික ස්ථානවලට අදාලව ගොඩනැගිලි සැලසුම් බොහොමයක් සභාවේ අනුමැතියක් නොමැතිව පවත්වාගෙන යාම නිසා ගැටළුකාරී තත්වයන්ට මුහුණ දීමට සිදු වී ඇත. එබැවින් සභාව මඟින් බලපත්‍ර ලබාගැනීමට පෙර ඊට අදාල ගොඩනැගිලි සැලසුම් අනුමත කරගන්නා ලෙස සියළු ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

**ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය**

මේ කාරණාව පිළිබඳව ඔය පුද්ගලයාවත් දැනුවත් කළා. ගමක පිටින් ඇවිල්ලා විවිධ දේවල් කරන්න බෑ. පන්සලේ ස්වාමීන් වහන්සේ, දායක සභාව ඇතුළු වගකීමක් දරන විවිධ මට්ටම්වල අය ඉන්නවා. මේ සභාවට හැමෝම ගෙන්වලා සාකච්ඡාවක් තිබ්බා. එතනදිත් අපි ඒ පුද්ගලයාට පැහැදිලි කරලා දුන්නා. ඊට පසුව අපේ පරිසර කමිටුව තියන දවසේ නැවතත් මන්ත්‍රීතුමා මේ ප්‍රශ්නය ඉදිරිපත් කළා. එතනදි අපි සමථයකට ආවා මේ වැරදි සියල්ල හදාගන්න තෙක් එම ස්ථානය පවත්වාගෙන යන්න දෙන්නේ නෑ කියලා. ඊට පසුව නැවත පරිසර කමිටුවේදි මේක ඉදිරිපත් කළාම තමයි මහජන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු කිව්වේ තවත් ගොඩනැගිලි තිබෙනවා කියලා. එතනදී අපි කිව්වා දීර්ඝකාලීනව පවත්වාගෙන ආපු ඒවාට අපිට නැවත බලපෑම් කරන්න බෑ, මෙතෙක් කල් පැවතුන

ඒවාගෙන් අපට ගැටලුවක් වුණේ නෑ. ඉදිරියේදී අපි මේවට ගොඩනැගිලි බලපත්‍ර ලබාදීමේදී නීත්‍යානුකූලව කටයුතු කරනවා කියලා අපි දැනුවත් කලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් කිරිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින මහ සභාව කාරක සභාවක් බවට පත් විය.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි,එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව පවතින කාරක සභාව මහ සභාවක් බවට පත් විය.

ඉහත කාරක සභා අවස්ථාවේදී ලේකම්තුමිය විසින් හෝටල්, ලැගුම්හල් හා නිවාඩු නිකේතන වැනි ව්‍යාපාරික ස්ථාන සඳහා සභාව මඟින් බලපත්‍ර ලබා ගැනීමට පෙර ඊට අදාල ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීමේ අවශ්‍යතාව පැහැදිලි කර දෙන ලදී.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අපේ බල ප්‍රදේශයේ වසම් 66 ක ව්‍යාපාරික ස්ථාන කරන බහුතරයකට ඇතිවී තිබෙන ප්‍රශ්නයක්. විශේෂයෙන්ම අලුතින් ව්‍යාපාර කරගෙන යන පුද්ගලයෙක් සම්බන්ධව මේ ටික ඇතුලත් කරන්න කියලා කියනවා. පැරණි ව්‍යාපාර කරන පුද්ගලයෝ යම්කිසි අලුත්වැඩියාවක් කරනවා නම් ඒ සම්බන්ධව ගැටලුවක් මතු වුනොත් මේ සභාවේ අද ගත්ත ඒකමතික තීන්දුව මත සාධාරණ මුදලක් අය කරලා ඔහුගේ හෝ ඇයගේ ගොඩනැගිලි ඉල්ලුම් පත්‍රයට අලුත්වැඩියා කරන කොටස ඇතුළත් කර අවශ්‍ය පහසුකම් සපයා දීමට මේ ගෙනා යෝජනාවටම ඇතුළත් කරන්න කියන ඉල්ලීම කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ යෝජනාව මා ස්ථිර කරනවා. පළමුවෙන්ම අපි කමිටුව ගත්ත යෝජනාව ඒකමතිකව ස්ථිර කරනවා. විශේෂයෙන්ම දැනට පවත්වාගෙන යන කටයුතු එලෙසම පවත්වාගෙන යාමටත්, අලුතින් ඉදි කරගෙන යාමේදී අවශ්‍ය නීති රාමුවට අදාලව ලිඛිතව සහතිකපත් නිකුත් කිරීමෙන් පසුව ඒ කටයුතු වල නියැලෙන්න කියලා කියනවා. ඒ වගේම හොඳ යෝජනාවක් ගෙනාවා ගරු විපක්ෂනායකතුමා.එහිදී මම අදහස් කරනවා වර්තමානයේ තිබෙන දරිද්‍රතාවයත් එක්ක ජනතාවගෙන් මල නොතලා රොන් ගන්න වෙනවා. ආදායම් පරීක්ෂක මහත්වරු නිරන්තරයෙන් මේ ව්‍යාපාරික ස්ථානවලට යනවා.ඔවුන්ට පුළුවන් හැම ව්‍යාපාරික ස්ථානවල අලුත්වැඩියාවක් කරන අවස්ථාවල අපි උදව් කරන්නම්, ඒ අදාල නීත්‍යානුකූල ක්‍රමයට යන්න කියලා දැනුවත් කරන්න. නීතියක් විදිහට වඩා ඉල්ලීමක් විදියට යනකොට ජනතාව ඒකට අනුගත වෙන්න කැමතියි. ආදායම් පරීක්ෂක මහත්මයා මේකේ නියෝජිතයා විදියට අපිට පත් කරන්න පුළුවන්. ඊට පස්සේ මේක

නීතියක් උන ගමන් නොයෙකුත් ආකාරයේ මානසික ආකල්ප වලට යන්න පුළුවන්. මම කියනවා අර යෝජනාවට මේ ටිකත් ඇතුළත් කරන්න කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මෙතෙක් මේ සභාවත් එක්ක ගනුදෙනු කරපු ප්‍රධාන සෞඛ්‍ය පරීක්ෂක මහත්වරු, MOH මහත්වරු අවබෝධයකින් කටයුතු කරපු නිසා ගැටළුවක් ඇති වුනේ නෑ. මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතුන් තමන්ගේ සීමාව නොතකා නම් කටයුතු කරන්න යන්නේ පළාත් සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්ට මේ සභාවේ අපේ 28 දෙනාගේම විරෝධතාවය ලියලා යවන්න, මේක නිවැරදි කරන්න කියලා. මොකද අසරණභාවයට පත් වෙන්නේ මේ බල ප්‍රදේශයේ පුද්ගලයෙක් නම් ඔහුට නඩු දානවා කියන එක නෙවෙයි මේකේ විය යුත්තේ. ඔහුට කරුණු අවබෝධ කරලා දීලා ඒ ටිකත් පිළිවෙලක් කරගෙන යන්න කියලා පොඩි තල්ලුවක් දීලා සමාජගත කරන්න පුළුවන්. ඒක තමයි කළ යුත්තේ.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එච්.ගාමිණී සෙනරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ගම් මට්ටමින් ඉන්නේ අහිංසක ජනතාව. මේ නීතිරීති රාමුවට කොටු වුණාම මේ ජනතාව අපහසුතාවයට පත්වෙනවා. අධිකරණ නීති, සෞඛ්‍ය අංශ නීති, ප්‍රාදේශීය ලේකම්ගේ නීති ආදී නොයෙකුත් නීති ගෙනැල්ලා අහිංසක මිනිස්සු හිර කරල දානවා. මේ එදා වේල කන්න නැති මිනිහා පුංචි කඩ කැල්ලක් දැම්මාම, නොයෙකුත් ප්‍රශ්න දැම්මම, අර පුද්ගලයාගේ මනස විකෘති වෙනවා. සභාපතිතුමියට පූර්ණ බලතල දෙන්න ඕනෑ. ගමේ ජනතාව එක්ක ඉන්න නියෝජිතයන්ගේ නායකයා සභාපතිතුමිය. ඔබතුමිය ගෙනා යෝජනාව අපි අනුමත කරනවා. ප්‍රාදේශීය සභාවේ නායකත්වය යටතේ මේ සියලුම ග්‍රාමීය ප්‍රදේශවල අහිංසක මිනිසුන් වෙනුවෙන් මේ යෝජනාව අනුමත කිරීම සුදුසුයි කියලා ප්‍රකාශ කරනවා.

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මහජන සෞඛ්‍ය පරීක්ෂක මහතාට වුණත් යම්කිසි නීති රාමුවක් තිබෙනවා. එතුමා ඒ නීති රාමුවක් ඇතුලේ කටයුතු කරනවා නම් අපි ඒකට යම් අනුගතවීමක් වෙන්න අවශ්‍යයි. අපි මේවට අනුමැතිය ලබා දීමේදී යම් ක්‍රමවේදයක් තිබෙන්න ඕනෑ. අපි සභාවක් හැටියට තීන්දු ගත්තා කියලා ඒක නීතියෙනුත් හරි යනවා නම් ප්‍රශ්නයක් නෑ. නීතියට පටහැනි ඒවාට අපි විරුද්ධ වුණාට කමක් නෑ. 2024 දී අපි යම් ක්‍රමවේදයක් ඇති කිරීම වැදගත්. ඒවගේම පසුගිය ඒවාට අනුමැතිය ලබාදීම සුදුසුයි. විශේෂයෙන්ම ඕනෑම දෙයක යම් කිසි පිළිවෙළක් තිබිය යුතුයි. අපි මිනිස්සු අනවශ්‍ය විදිහට හිර කරන්නේ නැතුව යම් කිසි ලිහිල් ප්‍රතිපත්තියකට යා යුතුයි.

ඒ අනුව හෝටල්, ලැගුම්හල් සහ නිවාඩු නිකේතන වැනි ව්‍යාපාරික ස්ථානවලට අදාලව ගොඩනැගිලි සැලසුම් සභාව මඟින් බලපත්‍ර ලබාගැනීමට පෙර ඊට අදාල ගොඩනැගිලි සැලසුම් අනුමත කරගන්නා ලෙස සියළු ව්‍යාපාරිකයන් දැනුවත් කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(05-5)<u>ගරු සභාපතිනි පද්මා වැත්තෑව මැතිනිය විසින් කරනු ලබන අංක 06/60 - 05 දරණ යෝජනාව</u>**

ගල්පොත්තේපොල වසමේ 8 කණුව සිට ගල්පොත්තේපොල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම යන යෝජනාව පරමාඋල්ල පුරාණ විහාරස්ථානයට ගිරිඋල්ල අලව්ව මාර්ගයෙන් ඇතුල්වන ස්ථානයේ සිට ඉදිරියට ඇති මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සුදුසු බවත් 2023 වර්ෂය සඳහා මහජන නියෝජිතයින් හට වෙන්කරනු ලබන රු. ලක්ෂ 5 ක ප්‍රතිපාදනය ඒ සඳහා යෙදවීම සුදුසු බවත් යෝජනා කරමි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මම ස්ථිර කරනවා. ඇත්තෙන්ම පෞරාණික ආගමික සිද්ධස්ථානයක් හැටියට අපිත් දකිනවා. අපි පොඩිකාලෙ අනිවාර්යෙන්ම වන්දනාවේ එක්ක එන තැනක් තමයි පරමාඋල්ල විහාරය. ඒ පාර දැන් දැක්කම ඇත්තෙන්ම කනගාටුදායකයි. අපි ආයතනයක් විදියට ඔබතුමිය පුළුවන් උපරිම අවස්ථාවක් දීලා ප්‍රමුඛතාවය ලබා දුන්නට කමක් නෑ. ඒ කටයුත්ත ඉටුකරල දෙන්න සභාව මැදිහත් වෙන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ අනුව ගල්පොත්තේපොල වසමේ 8 කණුව සිට ගල්පොත්තේපොල දක්වා මාර්ගය සංවර්ධනය කිරීම යන යෝජනාව පරමාඋල්ල පුරාණ විහාරස්ථානයට ගිරිඋල්ල - අලව්ව මාර්ගයෙන් ඇතුල්වන ස්ථානයේ සිට ඉදිරියට ඇති මාර්ගය සංවර්ධනය කිරීම ලෙස සංශෝධනය කිරීම සුදුසු බවත් ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය හට මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 2023 වර්ෂය සඳහා වෙන්කරනු ලබන රු. ලක්ෂ 5 ක ප්‍රතිපාදනය ඒ සඳහා යෙදවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-6)ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම් නිහාල් ඒකනායක මැතිතුමා විසින් කරනු ලබන අංක 06/60 - 06 දරණ යෝජනාව</u>**

2023 වර්ෂය සඳහා මහජන නියෝජිතයින් හට වෙන්කරනු ලබනරු. ලක්ෂ 5 ක ප්‍රතිපාදන පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

1. ඉහල කලල්පිටිය කන්ද මාර්ගයේ රංජි මහතාගේ නිවස අසල සිට සුසන්ත මහතාගේ නිවස අසලට කොන්ක්‍රීට් දැමීම. - රු.440,000.00
2. තිබ්බොටුවත්ත මද්දුම බණ්ඩාර පෙර පාසල වයරින් කර ඇති නිසා විදුලිය ලබා ගැනීම. - රු.60,000.00

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. නිහාල් ඒකනායක මැතිතුමා හට මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 2023 වර්ෂය සඳහා වෙන්කරනු ලබන රු. ලක්ෂ 5 ක ප්‍රතිපාදනය ඉහල කලල්පිටිය කන්ද මාර්ගයේ රංජි මහතාගේ නිවස අසල සිට සුසන්ත මහතාගේ නිවස අසලට කොන්ක්‍රීට් දැමීම. - රු.440,000.00 ක් හා තිබ්බොටුවත්ත මද්දුම බණ්ඩාර පෙර පාසල වයරින් කර ඇති නිසා විදුලිය ලබා ගැනීම. - රු.60,000.00 ක් ලෙස යෙදවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**<u>(05-7)ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා විසින් කරනු ලබන අංක 06/60 - 07 දරණ යෝජනාව</u>**

2023 වර්ෂය සඳහා මහජන නියෝජිතයින් හට වෙන්කරනු ලබන රු. ලක්ෂ 5 ක ප්‍රතිපාදන පහත සඳහන් යෝජනා සඳහා වෙන් කිරීම සුදුසු බවට යෝජනා කරමි.

1. වැලිකරය - පංගොල්ල මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම - රු. 250,000.00
2. තැම්පිටිගොඩ සිට ගල්ගමුව වැව දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධන කිරීම - රු.250,000.00

**ගරු උප සභාපති එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මම ස්ථිර කරනවා.

ඒ අනුව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්. අරුණ ජයලත් මැතිතුමා හට මන්ත්‍රී ප්‍රතිපාදන යටතේ 2023 වර්ෂය සඳහා වෙන්කරනු ලබන රු. ලක්ෂ 5 ක ප්‍රතිපාදනය වැලිකරය - පංගොල්ල මාර්ගය බොරළු දමා සංවර්ධනය කිරීම. - රු. 250,000.00 ක් හා තැම්පිටිගොඩ සිට ගල්ගමුව වැව දක්වා මාර්ගය බොරළු දමා සංවර්ධන කිරීම. - රු.250,000.00 ක් ලෙස යෙදවීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**06. <u>ඇස්තමේන්තු ඉදිරිපත් කිරීම - නැත.</u>**

**<u>07.නිවාඩු ලිපි ඉදිරිපත් කිරීම</u>**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, මාර්තු මස පැවති මහා සභාවට හා පහත කාරක සභා රැස්වීම්වලට සහභාගී නොවූ පහත සඳහන් ගරු මන්ත්‍රීතුමන්ලා හට නිවාඩු අනුමත කිරීම සුදුසු බවට මා යෝජනා කරනවා.

**2023/03/14 දින මහ සභාව සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**2023/02/27 දින නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**2023/02/28 දින පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**2023/02/28 දින සණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.ඒ නාරද සිරිවර්ධන මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී ධනුෂ්ක වීරසිංහ මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**2023/02/28 දින රෝග නිවාරණ සම්බන්ධයෙන් වන කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.චමින්ද සමන් කුමාර මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ජේ.එම් අරුණ ජයලත් මැතිතුමා
6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.පී නන්දසිරි මැතිතුමා

**2023/03/01 දින මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1. ගරු උප සභාපති - එච්.එම් ධර්මරත්න හේරත් මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.ඒ.පී ෂෙල්ටන් ප්‍රේමරත්න මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ජයතිලක මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ට්.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.ආර්.පී. කුමාර සෝමසිරි බණ්ඩාර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ ශ්‍රියානි වසන්තා රත්නායක මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.ඒ අනෝමා දිල්රුක්ෂි රණවීර මැතිනිය

**2023/03/03 දින කාර්මික සේවා කාරක සභා රැස්වීම සඳහා නිවාඩු අනුමත කිරීම**

1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඒ.චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - ආර්.එම්.ස්වර්ණා කාන්ති රාජපක්ෂ මැතිනිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.එච්.චමින්ද වීරවංශ මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ට්.ඒ යසිත් නිරංජන් විමලවර්ධන මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එස්.එම් ඉසුරු චතුරංග එදිරිවීර මැතිතුමා
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි - සී.ජී ශ්‍රියානි ජයලත් මැතිනිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ජී අජිත් ප්‍රේමලාල් පරණගමගේ මැතිතුමා

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව ඉහත මන්ත්‍රීතුමන්ලාගේ හා මන්ත්‍රීතුමියන්ලාගේ නිවාඩු අනුමත කිරීම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**08.කාරක සභා වාර්තා ඉදිරිපත් කිරීම.**

**(08.1) පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.02.28 දින පැවති පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2023.02.28 දින පැවති පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.02.28 දින පැවති පරිසර පොදු පහසුකම් පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.2) නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.02.27 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2023.02.27 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.02.27 දින පැවති නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.3) ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.02.28 දින පැවති ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, 2023.02.28 දින පැවති ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.02.28 දින පැවති ඝණ අපද්‍රව්‍ය කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**<u>(08.4)මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව</u>**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.03.01 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, 2023.03.01 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.03.01 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**(08.5)කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තා**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
2023.03.03දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි,2023.03.03 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කිරීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.රංජිත් කුමාරසිංහ මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව 2023.03.03 දින පැවති කාර්මික සේවා කාරක සභා රැස්වීම් වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**09. ප්‍රා.ස 14 වියදම් වාර්තාව හා වියදම් පුරෝකථන වාර්තාව සහ ප්‍රා.ස 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය හා ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කිරීම.**

**(09-1) ප්‍රා.ස 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**
අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි මස ප්‍රා.ස.14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**
ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි මස ප්‍රා.ස. 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය**
ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි මස ප්‍රා.ස. 14 වියදම් වාර්තාව සහ වියදම් පුරෝකථන වාර්තාව පිළිගැනිම සුදුසු බවට ඒකමතිකව සභා සම්මත විය.

**(09-2) ප්‍රා.ස 16 ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව**

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඉදිරිපත් කර තිබෙනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ චමින්ද වර්ණසූරිය මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි මස ප්‍රා.ස. 16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව පිළිගැනීම සුදුසු බවට මම යෝජනා කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි කේ.ඒ අමිතා කරුණානායක මැතිනිය**

ගරු සභාපතිතුමියනි, එම යෝජනාව මා ස්ථිර කරනවා.

ඒ අනුව අලව්ව ප්‍රාදේශීය සභාවේ 2023 පෙබරවාරි මස ප්‍රා.ස.16 ඒකාබද්ධ ලැබීම් සාරාංශය සහ ආදායම් පුරෝකථන වාර්තාව ඒකමතිකව සභා සම්මත විය.

**10. වෙනත් කරුණු ඉදිරිපත් කිරීම**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, පසුගිය සභා වාරයේදී ලබාදුන් ගැසට් කරන ලද මාර්ග ලේඛනය බලන විට ඒ මාර්ග බොහොමයක් ලේඛනගත වෙලා නැහැ. තව සඳහන් කරන ලද මාර්ග වල නම් වෙනස් විය යුතුයි. මම ඒවා සඳහන් කර ගෙන ආවා අදාල ඉදිරි කටයුතු සඳහා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.ඒ.සී. නිලූ ගුණරත්න මැතිනිය**

ගරු සභාපතිතුමියනි, ගොරොක්ගස්දෙණිය ප්‍රදේශයේ අංක 04 දරණ මාර්ගය පසුගිය දෙසැම්බර් 26 වැනිදා පැති කාණුවක් කපලා තිබෙනවා. ඒ කානුව කපද්දී පස් කොටසක් පාරට දාලා තියෙනවා. ඉතුරු කොටස පැත්තකින් ගොඩගහලා තිබෙනවා. පසුගිය දෙසැම්බර් 26 ඉඳලා මේ දක්වා මේ පස් ගොඩගහලා තිබෙනවා. නමුත් සභාවෙන් මේ පස් ගෙනියනවා කියලා ප්‍රදේශවාසීන්ට දැනුවත් කරලා තිබුනත් අද දක්වා මේ පස් ගෙනිහිල්ලා නෑ. එතැන අනතුරක් තිබෙනවා. පාරට පස් දැමීමත් එක්ක එතන පාර අඩි දෙකක් තුනක් උස් වෙලා තිබෙනවා. කපපු කාණුව තවත් ගැඹුරු වෙලා තිබෙනවා. වතුර පිරිලා තිබෙන වෙලාවක දරුවෙක්වත් වැටුනොත් ලොකු අනතුරක් වෙනවා. මේ සම්බන්ධයෙන් දැනට පවතින තත්ත්වය පිළිබඳව කරුණු පැහැදිලි කරන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

කානුව කපන දවසේ ඉඳලා ඔය ප්‍රදේශයේ අයගෙන් නිර්නාමික ලිපි එනවා. මොනවාහරි ප්‍රශ්නයක් තිබෙනවා නම්, නමක් ගමක් දාලා එව්වනම්, අපිට ඒ අයත් එක්ක කතා කරන්න පුළුවන්. නමුත් මේ කපපු පස් අයින් කරන්න කීප වතාවක්ම මෝටර් ග්‍රේඩරය දාලා, අවශ්‍ය උපකරණ දීලා සූදානම් වෙනකොට එක එක අයගේ විවිධ අදහස් එනවා. එක ලිපියක් අපි කමිටුවට ඉදිරිපත් කළා. එක ලිපියක් තිබුනේ ක්‍රීඩා පිට්ටනියක් හදනවා, එතැනම පාරේ වලක් තිබෙනවා, ඒකට පස් ටික දාල දෙන්න කියලා. නිර්නාමික දුරකථන ඇමතුම්, ලිපි එනකොට මම කිව්වා මේ කොට්ඨාශයට මන්ත්‍රීවරුන් තුන් දෙනෙක් ඉන්නවා. කාර්මික නිලධාරීතුමාට අපි කිව්වා ඒ කරපු වැඩේ අවසන් කරන්න කියලා. එක කොටසක් පස් ගෙනියන්න ලෑස්ති වෙනකොට ඒකට විරුද්ධ වෙනවා. මේ වගේ කඹ ඇදිල්ලක් තමයි තිබුනේ. අන්තිමට පස් ටික ගෙනල්ලා මේ සභාවේ පස් දාන තැනට දාන්න කටයුතු කරනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ මොහාන් සුජීව වික්‍රමනායක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඉල්ලීමක් කළා ඔය පාරේ රුවන් මහත්මයා පාර අඩියක් යටට හාරලා ගල් අල්ලන්න. මම කිව්වා පාරේ අඟල් හතරක් යටට හාරලා ගල් අල්ලමු කියලා. ඔහොම ප්‍රශ්න ගණනාවක් ආවා. පාරේ වලට හරි නැත්නම් දෙහිපත්උල්ලේ ක්‍රීඩාපිටියට හරි මේ පස් දාන එක සුදුසුයි. පෞද්ගලිකව කාට හෝ දෙනවා නම් විරුද්ධයි කියලා මම කීවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. චාමින්ද ප්‍රියන්ත අතුකෝරාල මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, ඒ ප්‍රදේශයේ රුවන් මහත්මයා කතා කරලා කිව්වා මේ සම්බන්ධව යම් ක්‍රියාමාර්ගයක් ගන්න කියලා. ඔබතුමියගෙන් ඉල්ලා සිටිනවා ඔය ප්‍රශ්නය ඉවර වෙන්න, ඔය පස් ටික ඉවත් කරලා දෙන්න පුළුවන් නම් ඉතා උචිතයි කියලා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම් ජයතිලක මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, බෝයවලාන උපකාර්යාලයේ ළිඳේ වතුර නැති එක ගැටලුවක්. සතියකට එක වතාවක් වතුර බවුසරයක් ඒ ළිඳට ගෙනිහින් දැම්මොත් මේ වතුර ප්‍රශ්නය විසඳාගන්න පුළුවන්. ඒ සඳහා ඔබතුමියගේ කාරුණික අවධානය යොමු කරන්න කියලා ඉල්ලා සිටිනවා. ඒත් එක්කම අලව්ව පොළ අවුරුද්දෙන් ඉස්සර පාරිභෝගික ජනතාවට ලබාදෙන පුළුවන්ද කියන එක දැනගන්න කැමතියි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී නලින් ඩයස් රාජපක්ෂ මැතිතුමා**

ගරු සභාපතිතුමියනි, වෙළෙඳ සංගමයේ පිරිසක් අතරින් කොටසක් ඒ ඒ පුද්ගලයන්ට අවශ්‍ය තැන්වල ස්ථානගත වෙලා දැන් හොඳට හදාගෙන එතැන ඉන්නවා. නමුත් තව ගොඩක් පිරිසක් ඉන්නවා ගෙවල්වලට වෙලා තාමත් වෙළඳාමක් නැතිව. ප්‍රධාන වෙළෙන්දෝ කීපදෙනෙක් ඒ අයගේ ගෙවල් ඉස්සරහ යම් යම් තැන් වල තමන්ට ව්‍යාපාරය කරගන්න පුළුවන් විදිහට හොඳට හදාගෙන ඒ තැන් වල ඉන්නවා. ඒ අයට උවමනාවක් නෑ පොළට යන්න. මොකද එතකොට දැන් තිබෙන වෙළඳාම අඩු වෙනවා. තවත් ගොඩක් ඉන්නවා මේ වෙළඳාමට එන්න බැරිව. ඒ නිසා පොළ ලබා දෙන්න පුළුවන් නම් හොඳයි. අපි වෙළඳ සංගමය කතා කරලා තිබෙනවා කඩ කීපයක් කරපු අයටත් එක් කඩයක් පමණක් ලබාදීමට.

**ගරු සභාපතිනි පද්මා වැත්තැව මැතිනිය**

පොළ ආරම්භ කිරීමට කටයුතු කරන කොට විවිධ පුද්ගලයන්ගෙන් විවිධ අඩුපාඩු කියලා විවිධ පැමිණිලි එනවා. කඩ කීපයක් කරපු අය ඒ කඩ කීපයම ඉල්ලනවා. ඒ වගේ විවිධ ගැටළු එනවා. ඒ වගේම අපිට එන්න තිබෙන ආදායමක් තමයි අපි මේ තාවකාලික පොළේ කුලිය විදියට ගෙවන්නේ.

ඒ අනුව අද දිනට නියමිත න්‍යායපත්‍රානුකූලව සාකච්ඡා කල යුතු කරුණු අවසන්. ප්‍රදේශයේ ජනතාව වෙනුවෙන් එක් රැස් වූ උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා හා මන්ත්‍රීතුමියන්ලාටත්, ලේකම්තුමිය ඇතුලු කාර්ය මණ්ඩලයේ සියලු දෙනාටත් ස්තූතිය පල කරනවා.

අද දිනට නියමිත සභාවේ කටයුතු නිමා කරනවා.

මෙදින ප.ව 1.00ට පමණ සභාවේ කටයුතු නිමාවට පත් විය.

2023/03/14
අලව්ව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේදී

සභාපති,
අලව්ව ප්‍රාදේශීය සභාව,
අලව්ව.